


# විනය පිටකය

# විනය පිටකය

ජී. හෙන්රි පෙරේරා

දම්සක් අංක 93/94

බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන සමිතිය

# විනය පිටකය

ඊ. හෙක්ටර් පෙරේරා

බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන සමිතිය
තැ: පෙ: 61 — මහනුවර

2518
1975

# වචනයක්

විනය පිටකය පිළිබඳ ලුහුඬු එහෙත් සම්පූර්ණ විස්තරයක් දක්වෙන මෙම කුඩා පොත සකස්කරන ලද්දේ බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන සමිතියේ ආරාධනය පරිදි ය. බුදු දහම ලොව පැතිරවීම පිණිස ඉමහත් සේවයක් ඉටු කරන පූජ්‍ය ඥනපෝනික මහ හිමි-පාණන්ට සහ රිචඩ් අබේසේකර මහත්මාට සැම බෞද්ධයකු ම බෞද්ධයකු වශයෙන් සද ණය ගැති ය. මෙම කුඩා පොත එම සේවයට පූජා උපහාරයක් වේවා යි පතනුයේ එබැවිනි.

රී. හෙක්ටර් පෙරේරා
බෞද්ධ විශ්වකෝෂයේ උප කර්තෘ

දම්සක් පොත් පෙළ අංක 93/94

# කෙටි යෙදුම්

| | |
|---|---|
| **අත්ථ.** | අත්ථසාලිනී |
| **චූ.ව.** | චූල්ලවග්ග |
| **ප.පා.** | පරිවාරපාඨ |
| **ම.ව.** | මහාවග්ග |
| **මි.** | මිලින්ද-පඤ්හ |
| **ස.ම.** | සමන්තපාසාදිකා |
| **සුම.** | සුමඞ්ගලවිලාසිනී |
| **සු.වි.** | සුත්තවිභඞ්ග |
| **විනය.** | විනය පිටක |

පාඨකයාගේ අවධානය පාලි පොත පතට යොමු කළ හැම විට ම ඉවහල් කර ගන්නා ලද්දේ 'පාලි ග්‍රන්ථ සංගමය' මගින් මුද්‍රිත පොත පත ය.

# විනය පිටකය

**විවිධ විසෙස නයත්තා - විනයනතො චෙව කායවාචානං,**
**විනයත්ථ විදූහි අයං - විනයො විනයොති අක්ඛාතො.**

සැදැහැයෙන් සසුන් වන් භික්ෂු භික්ෂුණීයන් සංවරයෙහි පිහිටුවීම පරමාර්ථ කොට "කායවාග්ද්වාරයන් මනා-කොට හික්මවන නොයෙක් ප්‍රකාර විශෙෂ නයක්‍රමයන් ඇති ධර්ම කොට්ඨාශයට 'විනය-ධර්මය'යි විනයාර්ථ දත් නැණවතුන් විසින් කියන ලදී." විනය පිටකය සුත්ත පිටකය සහ අභිධම්ම පිටකය වශයෙන් කොටස් තුනකින් යුත් ත්‍රිපිටකයෙහි විනය ධර්මය ඇතුලත් කොටස 'විනය පිටකය' නමින් හැඳින් වේ.

විනය පිටකය ප්‍රධාන වශයෙන් කොටස් තුනකට බෙදා ඇත. එනම්, විභඞ්ග (සුත්ත විභඞ්ග), ඛන්ධක සහ පරිවාර යනුවෙනි. විභඞ්ග 'භික්ඛු විභඞ්ගය' සහ 'භික්ඛුණී විභඞ්ගය' යනුවෙන් ද, ඛන්ධක 'මහාවග්ගය' සහ 'චුල්ලවග්ගය' යනුවෙන් ද කොටස් කොට ඇත. භික්ඛු විභඞ්ගය 'පාරාජිකා' සහ 'පාචිත්තිය' යනුවෙන් කොටස් දෙකකට බෙදීම මැනවි. මෙසේ විනය පිටක-යෙහි ග්‍රන්ථයන් බෙදිය හැකි ආකාරය:

**විනය පිටකය**

↓

- 1. සුත්තවිභඞ්ග
  - 1. භික්ඛුවිභඞ්ග
    - 1. පාරාජිකා
    - 2. පාචිත්තිය
  - 2. භික්ඛුණීවිභඞ්ග
- 2. ඛන්ධක
  - 1. මහාවග්ග
  - 2. චුල්ලවග්ග
- 3. පරිවාර

යන සටහනින් වඩාත් පැහැදිලි ය.

එහෙත් මේ කොටස් සියල්ලම එකම වකවානුවකට අයත් නැත. එනම්, විනය පිටකය එකම වකවානුවක ඇති වූවක් නොවේ. එය ක්‍රමයෙන් වැඩී ඇති වූවකි.

## සුත්තවිභඞ්ගය

කාලනිර්ණය අනුව විනය පිටකයෙහි කොටස් අතුරෙන් සුත්තවිභඞ්ගයට හිමිවනුයේ ප්‍රමුඛ ස්ථානයකි. සුත්තවිභඞ්ගයෙහි සඳහන් ඓතිහාසික කරුණු අනුව සුත්තවිභඞ්ගය බුද්ධ පරිනිර්වාණයට වඩා ඈත් නොවූ කාලයක ඇති වූවක් යැයි සිතිය හැකි ය. එහෙත් සුත්තවිභඞ්ගය කිසිවකු විසින් එකම වකවානුවක නිපදවූවක් නොවේ. එය ක්‍රමයෙන් වැඩී ඇති වූවකි.

සුත්තවිභඞ්ගය බුද්ධ කාලයේම සම්පූර්ණ නොවූවක් වුවත්, එහි ඇති බොහෝ විනය නීති බුදුරදුන් විසින්ම දේශනා කරන ලද බවට කිසිම සැකයක් නැත. එහෙත් විනය නීති පැන වූයේ සූත්‍රයන් බොහෝමයක් දේශනා කිරීමෙන් පසුව ය.[2] ඒ හෙයින්ම සූත්‍ර විනය නීතිවලට පසුබිම වී ඇත. සුත්ත පිටකය බෙදී ඇති දීඝ, මජ්ඣිම, සංයුත්ත, අංගුත්තර සහ ඛුද්දක යන නිකාය පසට මුළු ත්‍රිපිටකයම බෙදී විනය පිටකය සහ අභිධම්ම පිටකය ඛුද්දක නිකායට ඇතුලත්ව පැවැති බව බුද්ධඝොෂ

---

[1] බුද්ධත්වය ලැබ වැඩ විසූ අවුරුදු සතළිස්-පහ තුළ---එනම්, ක්‍රි. පූර්ව. 528-483.

[2] බුදුරදුන්ගේ ප්‍රථම දේශනය වූයේත් සූත්‍රයෙකි. එනම්, "ධම්ම-චක්කප්පවත්තන" සූත්‍රයයි. විනය නීති පැන වූයේ භික්ෂු පිරිස ඇති වී, වැඩි වී, පැතිරී ඔවුන්ගේ පැවැත්ම විෂම වූවාට පසුව ය. (සමයාන්තර බලපෑම ද විනය නීති ඇතිවීමට හේතු නොවූයේ නොවේ.)

හිමියන් දක්වීම[1] විනය නීතිවලට සූත්‍ර පසුබිම වී ඇති බව දක්වීමට සාධකයක් වශයෙන් ගත හැකි ය. මෙය, මජ්ඣිම නිකායෙහි 'අනුමාන' සූත්‍රය භික්ෂු විනය වශයෙන් ද, දීඝ නිකායෙහි 'සිඞගාලොවාද' සූත්‍රය ගිහි විනය වශයෙන් ද හැඳින්වූ බව දක්වෙන බුද්ධඝොෂ හිමියන්ගේ කියමනෙහි සත්‍යතාවය අනුව වඩාත් තහවුරු කළ හැකි ය. කෙසේ වෙතත්, පංච නිකායන්හි, විශෙෂයෙන්ම අංගුත්තර නිකායෙහි, සූත්‍රවල විනය නීතිවලට තුඩු දුන් කොටස් පෙනෙන හෙයින් සූත්‍ර විනය නීතිවලට පසුබිම වූ බව පැහැදිලි ය. මෙය තව දුරටත් පාතිමොක්ඛයේ අවසාන වාක්‍යයෙන් ද පැහැදිලි වේ— "ඒ භාග්‍යවතුන් වහන්සේගේ (ධර්මයන්) මෙ පමණක් සූත්‍රාගත වූයේ, සූත්‍රයට ඇතුළත් වූයේ, අර්ධ මාසයකට වරක් උදෙසීමට පැමිණෙයි."[2]

පාතිමොක්ඛය සුත්තවිභඞගයේ පදනම වේ. සුත්තවිභඞගය වැඩී ඇති වූයේ පාතිමොක්ඛය මත ය. එහෙත් පාතිමොක්ඛය ද වැඩී ඇති වූවකි. පාතිමොක්ඛයෙහි සඳහන්ව ඇති ශික්ෂාපද සියල්ලම, එනම්—ශික්ෂාපද දෙසිය විසි හතම, බුද්ධපරිනිර්වාණයේදී සම්පූර්ණ වී

---

1 සුම. 23 වෙනි පිටුවෙහි— "කතමො ඛුද්දක නිකායො? සකලං විනයපිටකං අභිධම්මපිටකං ඛුද්දක පාඨාදයො ච පුබ්බෙ-නිදස්සිත-පඤ්චදස-භෙද, ඨපෙත්වා චත්තාරො නිකායෙ අවසෙසබුද්ධවචනං." අත්ථ.26 වෙනි පිටුවෙහි— "කතමො ඛුද්දක නිකායො? සකලං විනය පිටකං අභිධම්මපිටකං ඛුද්දකපාඨ-ධම්මපදදයො ච පුබ්බෙ දස්සිත-බුද්දසප්පභෙද, ඨපෙත්වා චත්තාරො නිකායෙ අවසෙසබුද්ධවචනං."

2 සු. වි. 207 වෙනි පිටුවෙහි— "එත්තකං තස්ස භගවතො සුත්තාගතං සුත්තපරියාපන්නං අන්වද්ධමාසං උද්දෙසං ආගච්ඡති."

තිබීයැ යි සිතිය නොහැකි ය. ප්‍රථම සඞ්ගායනාව පිළිබඳ චුල්ලවග්ගයෙහි දක්වෙන පාඨයෙන් පාතිමොක්ඛයෙහි වැඩීම වටහා ගත හැකිය. තම ශ්‍රාවකයින්, බැහැර කිරීමට සුදුසු යැ යි සිතන සුළු සුළු ශික්ෂාපද බැහැර කිරීමට බුදුරදුන් මරණ-මඤ්චකයෙහිදී දුන් ප්‍රතිඥාව ප්‍රථම සඞ්ගායනාවට සම්බන්ධ වූ භික්ෂූන් අතර විවාදයකට භාජන වූ බව එහි සඳහන්ව ඇත. බැහැර කිරීමට සුදුසු සුළු සුළු ශික්ෂාපද කිමෙක් දැයි තීරණය කිරීමට ඔවුන්ට නොහැකි විය. සමහරු පාරාජිකා සතර හැර අන් සියල්ලම බැහැර කළයුතු සුළු සුළු ශික්ෂාපද යැ යි කීහ. සමහරු පාරාජිකා සතර, සහ සඞ්ඝාදිසෙස දහතුන හැර අන් සියල්ලම බැහැර කළයුතු සුළු සුළු ශික්ෂාපද යැ යි කීහ. සමහරු පාරාජිකා සතර, සඞ්ඝාදිසෙස දහතුන සහ අනියත දෙක හැර අන් සියල්ලම බැහැර කළයුතු සුළු සුළු ශික්ෂාපද යැයි කීහ. සමහරු පාරාජිකා සතර, සඞ්ඝාදිසෙස දහතුන, අනියත දෙක සහ නිස්සග්ගිය-පාචිත්තිය තිහ හැර අන් සියල්ලම බැහැර කළයුතු සුළු සුළු ශික්ෂාපද යැ යි කීහ. සමහරු පාරාජිකා සතර, සඞ්ඝාදිසෙස දහතුන, අනියත දෙක, නිස්සග්ගිය-පාචිත්තිය තිහ සහ පාචිත්තිය අනූදෙක හැර අන් සියල්ලම බැහැර කළයුතු සුළු සුළු ශික්ෂාපද යැ යි කීහ. සමහරු පාරාජිකා සතර, සඞ්ඝාදිසෙස දහතුන, අනියත දෙක, නිස්සග්ගිය-පාචිත්තිය තිහ, පාචිත්තිය අනූදෙක සහ පටිදෙසනිය සතර හැර අන් සියල්ලම බැහැර කළයුතු සුළු සුළු ශික්ෂාපද යැ යි කීහ.[1] මෙතෙකින් බැහැර

---

[1] චු. ව. xi, 1, 9-- ''එකච්චෙ ථෙරා එවං ආහංසු: චත්තාරි පාරාජිකානි ඨපෙත්වා අවසෙසානි ඛුද්දානුඛුද්දකානි සික්ඛාපදානීති.

කිරීමට සුදුසු සුළු සුළු ශික්ෂාපද පිළිබඳ ඔවුන්ගේ විවාදය බැහැර කළ යුතු ශික්ෂාපද කිමෙක් දැයි සඳහන් නොකරම නැවතිණ. එහෙත් සම්පූර්ණ පාතිමොක්ඛයෙහි ශික්ෂාපද දෙසිය විසිහත සම්පූර්ණ වනුයේ මේ ශික්ෂා-පදවලට (ශික්ෂාපද එකසිය සතලිස් පහට) අධිකරණ-සමථ සතත්, සෙඛිය ශික්ෂාපද හැත්තෑ පහත් එක්කළ විට ය. අධිකරණ-සමථ සතත්, සෙඛිය ශික්ෂාපද සැත්තෑ පහත් ප්‍රථම සඞ්ගායනාකාර භික්ෂූන් සඳහන් නොකළේ ඔවුන් දැන සිටි පාතිමොක්ඛයෙහි[1] මේ ශික්ෂාපදවලට

---

එකච්චෙ ථෙරා එවං ආහුංසු: චත්තාරි පාරාජිකානි ඨපෙත්වා තෙරස සංඝාදිසෙසෙ ඨපෙත්වා අවසෙසානි ඛුද්දනුඛුද්දකානි සික්ඛාපදනීති. එකච්චෙ ථෙරා එවං ආහුංසු: චත්තාරි පාරාජි-කානි ඨපෙත්වා තෙරස සංඝාදිසෙසෙ ඨපෙත්වා වෙ අනියතෙ ඨපෙත්වා අවසෙසානි ඛුද්දනුඛුද්දකානි සික්ඛාපදනීති. එකච්චෙ ථෙරා එවං ආහුංසු: චත්තාරි පාරාජිකානි ඨපෙත්වා තෙරස සංඝාදිසෙසෙ ඨපෙත්වා වෙ අනියතෙ ඨපෙත්වා තිංස නිස්සග්ගියෙ පාචිත්තියෙ ඨපෙත්වා අවසෙසානි ඛුද්දනුඛුද්දකානි සික්ඛාපදනීති. එකච්චෙ ථෙරා එවං ආහුංසු: චත්තාරි පාරාජිකානි ඨපෙත්වා තෙරස සංඝාදිසෙසෙ ඨපෙත්වා වෙ අනියතෙ ඨපෙත්වා තිංස නිස්සග්ගියෙ පාචිත්තියෙ ඨපෙත්වා වෙනවුතිං පාචිත්තියෙ ඨපෙත්වා අවසෙසානි ඛුද්දනුඛුද්දකානි සික්ඛාපදනීති. එකච්චෙ ථෙරා එවං ආහුංසු; චත්තාරි පාරාජිකානි ඨපෙත්වා තෙරස සංඝාදිසෙස ඨපෙත්වා වෙ අනියතෙ ඨපෙත්වා තිංස නිස්සග්ගියෙ පාචිත්තියෙ ඨපෙත්වා වෙනවුතිං පාචිත්තියෙ ඨපෙත්වා චත්තාරි පටිදෙසනියෙ ඨපෙත්වා අවසෙසානි ඛුද්දනුඛුද්දකානි සික්ඛා-පදනීති.''

[1] ප්‍රථම සඞ්ගායනාකර භික්ෂූන් දැන සිටි පාතිමොක්ඛය ශික්ෂාපද එකසිය-පනස්-දෙකකින් පමණ යුක්ත වන්නට ඇතැයි බී. සී. ලෝ මහතා සිතයි. ශික්ෂාපද දෙසිය විසි-හතෙන් සෙඛිය ශික්ෂාපද හැත්තෑ පහ අඩු කළ විට ශික්ෂාපද එකසිය-පනස්-දෙකක් වේ.

තැනක් නො තිබුණ බැවින් යැ යි සැක කළ හැකි ය.[1] අංගුත්තර නිකායෙහි කොටස් දෙකකම ශික්ෂාපද එකසිය-පනහකින් පමණ (සාධිකං දියඩ්ඪසික්ඛාපදසතං) යුත් පාතිමොක්ඛයක් ගැන සඳහන්ව තිබීමෙන් මේ සැකය තවත් තහවුරු වෙයි. පරිවාර-ග්‍රන්ථයෙහි ද ශික්ෂාපද එකසිය පනහකින් පමණ (දියඩ්ඪමත්තානි සික්ඛාපද සතානි) යුත් පාතිමොක්ඛයක් පිළිබඳ සඳහන් වේ. මෙයින් ශික්ෂාපද දෙසිය-විසි-හතකින් යුත් සම්පූර්ණ පාති-මොක්ඛය වැඩි ඇති වූවක් යැ යි සිතිය හැකි ය.[2]

පාතිමොක්ඛයට කළ අන්‍ය අටුවාවක් ද[3] එක් විය. ඒ අටුවාවෙන් පාතිමොක්ඛ ශික්ෂාපද වචනයෙන් වචනයක් පාසා විභාග කර තව තවත් විස්තර වේ. මේ විස්තර එහි ශෛලිය අනුව සලකා බලනවිට බුදුරදුන් විසින් දෙශනා කරන ලද්දක් නොවිය හැකි යැයි ඔල්ඩන්බර(ර්)ග් මහතා කියයි.

පසු කාලයකදී අටුවාවකින් විශාල වූ පාතිමොක්ඛයට ශික්ෂාපද පිළිබඳ ඓතිහාසික කතාවක් ද එක් විය. ශික්ෂාපද පැනවීමට හේතුවූ කාරණය, පුද්ගලයා,

---

[1] තවද මේ ශික්ෂාපද ඔවුන් දැන සිටි පාතිමොක්ඛයෙහි පූර්ව නාම මෙය බැහැර කළයුතු සුළු ශික්ෂාපද හැටියට සැලකූවි යැ යි සිතිය නොහැකි ය.

[2] පාතිමොක්ඛ ශික්ෂාපද ද බුදුරදුන් විසින් දෙශනා කරන ලද්දේ එකම අවස්ථාවකදී නොව, යම් යම් අවස්ථාවලදී ඇති වූ අවශ්‍යතාවය අනුව ය.

[3] මෙහි පාතිමොක්ඛයෙහි නිදාන කථා වස්තුව පිළිබඳ කොටස හැර අන් සියලුම විස්තර සුත්තවිභඞ්ගයට ඇතුළත් වී ඇත. පාති-මොක්ඛයෙහි නිදාන කථා වස්තුව පිළිබඳ කොටස මහාවග්ගයෙහි සඳහන් වේ:— ම. ව. II. 3.3— මෙහි පතු දැක්වේ.

ස්ථානය ආදී කරුණු මෙයින් දක්වින.

මෙසේ ක්‍රමයෙන් වැඩී ශික්ෂාපද පිළිබඳ අටුවාවකින් ද ඓතිහාසික හැඳින්වීමකින් ද යුක්ත වූ පාතිමොක්ඛය සූත්තවිභඞ්ගයේ ස්වරූපය ගත්තේ ය. ක්‍රමයෙන් වැඩී සම්පූර්ණ වූ නමුත් සූත්තවිභඞ්ගය විනය පිටකයෙහි පැරණිතම ග්‍රන්ථය වේ.

සූත්තවිභඞ්ගය මෙන්ම ඛන්ධක (පරිච්ඡේද) දහයකින් යුත් මහාවග්ගය ද, ඛන්ධක (පරිච්ඡේද) දොළොසකින් යුත් චූල්ලවග්ගය ද[1] විනය පිටකයෙහි පැරණි ග්‍රන්ථ වේ.

## මහාවග්ග සහ චූල්ලවග්ග

සූත්තවිභඞ්ගය සම්පූර්ණ වූවාට පසුව ය, මහාවග්ගය සහ චූල්ලවග්ගය සම්පූර්ණ වූයේ.[2] චූල්ලවග්ගයේ දෙවැනි සඞ්ගායනාව පිළිබඳ විස්තරයක් දක්වෙන දොළොස්වැනි අවසන් පරිච්ඡේදයෙහි සූත්තවිභඞ්ග පාඨ සටහන් කර ඇති බැවින්[3] එම පරිච්ඡේදය සූත්තවිභඞ්ගයට පසුව ඇතිවී යැ යි සිතිය හැකිය. චූල්ලවග්ගයෙහි ප්‍රථම සඞ්ගායනාව පිළිබඳ විස්තරයක්

---

[1] මේ ඛන්ධක විසිදෙකෙහි ශාසන ඉතිහාසය බුද්ධත්වය ලැබූ තැන් පටන් විශාලා මහනුවර වූ දෙවැනි සඞ්ගායනාව තෙක් පිළිවෙලින් විස්තර වේ.

[2] මහාවග්ගයේ සහ චූල්ලවග්ගයේ සමහර කොටස් සූත්තවිභඞ්ගයේ සමහර කොටස්වලට වඩා පැරණිවීමට බැරි නැත. එහෙත් සම්පූර්ණ වශයෙන් මහාවග්ගය සහ චූල්ලවග්ගය නිමවූයේ සූත්තවිභඞ්ගය සම්පූර්ණ වශයෙන් නිම වූවාට පසුව ය.

[3] මෙය ඕල්ඩන්බ(ර්)ග් මහතා පෙන්වා දී ඇත.

දක්වෙන එකොළොස්වැනි පරිච්ඡේදයෙහි 'උභතො විනය'[1] පිළිබඳ සඳහන් වන බැවින් එම පරිච්ඡේදය ද සූත්තවිභඞ්ගයට පසුව ඇති වී යැ යි සිතිය හැකිය. එහි 'පඤ්චනිකාය' පිළිබඳ ද සඳහන් වන බැවින් දීඝ, මජ්ඣිම, සංයුත්ත, අංගුත්තර සහ ඛුද්දක යන නිකාය පස ද එයට ප්‍රථම ඇති වන්නට ඇතැයි සිතිය හැකිය. එහෙත් එහි සඳහන් වනුයේ දීඝ නිකායේ 'බ්‍රහ්මජාල' සූත්‍රයෙහිත්, 'සාමඤ්ඤඵල' සූත්‍රයෙහිත් සඳහන් කරුණු පමණ ය. දිඝනිකායෙහි අනිකුත් සූත්‍රවල සඳහන් කරුණු ද, අනිකුත් නිකායවලට අයත් සූත්‍රවල සඳහන් කරුණු ද එහි සඳහන් නොවන බැවින් එයට ප්‍රථම නිකාය පස (අද අප අතර ඇති පරිදි) සම්පූර්ණ වන්නට ඇතැයි සිතිය නොහැකි ය. කෙසේ වෙතත් මෙතෙක් අභිධම්ම පිටකය ගැන සඳහන් වීමක් නැත. අභිධම්ම පිටකය ගැන මෙහි ඇති එකම හැඳින්වීම උද්දානගාථාවල 'ත්‍රිපිටකය' (පිටකං තිනි) යන්න සඳහන්වීම පමණ ය. එහෙත් උද්දානගාථා පසුව එක්වූවක් බව පැහැදිලිවම පෙනෙන හෙයින් උද්දානගාථා දක්වෙන කරුණු අනුව පැරණි ත්‍රිපිටක ග්‍රන්ථවල කාලනිර්ණය දක්වීම යුතු නොවේ.

විනය පිටකයෙහි ඛන්ධක දෙවිස්ස, එනම්—මහාවග්ග සහ චුල්ලවග්ග, සම්පූර්ණ වූයේ සුත්තවිභඞ්ගයේ සම්-

---

[1] සමහරු 'උභතො විනය' යනුයෙන් භික්ඛුවිනය සහ ගිහිවිනය හැඳින්වෙත්. එහෙත් චුල්ලවග්ග පාඨයෙහි 'උභතොවිනය' යනුවෙන් හැඳින්වනුයේ භික්ඛුවිභඞ්ගය සහ භික්ඛුණීවිභඞ්ගය යන කොටස් දෙකකින් යුත් **සුත්තවිභඞ්ගය ය**:

| | | |
|---|---|---|
| උභතො විනය | 1. භික්ඛුවිනය - භික්ඛුවිභඞ්ගය | සුත්ත විභඞ්ගය |
| | 2. භික්ඛුණීවිනය - භික්ඛුණීවිභඞ්ගය | |

පූර්ණවීමටත්, දීඝ, මජ්ඣිම, සංයුත්ත, අංගුත්තර සහ ඛුද්දක යන පඤ්චනිකායවල පැවැත්මටත් පසුව මුත් අභිධම්ම පිටකයට ප්‍රථම බව ඉහත දක්වූ කරුණුවලින් පැහැදිලි වේ. ඛන්ධකවල වැඩීම දෙවැනි සඞ්ගායනාවේ විස්තරය ඇතුළත්වීමෙන් නතර වූයේ යැ යි බී. සී. ලෝ මහතා කියයි. දෙවැනි සඞ්ගායනාවේ විස්තරය ඇතුළත් වීමෙන් ඛන්ධකවල වැඩීම නතර නොවූයේ නම්, ඊට පසුව ඇතිවූ සඞ්ගායනාවන්, විශෙෂයෙන්ම අශෝක රජු සමයෙහි වූ තෙවැනි සඞ්ගායනාව, පිළිබඳ විස්තර එයට එක්විය යුතුව තිබුණේ යැ යි ඔහු අදහස් කරයි. එබැවින් ඛන්ධකවල සම්පූර්ණවීම අශෝක රජු සමයට ප්‍රථම වූයේ යැ යි ඔහු නිගමනය කරයි. විනය පිටකය (චුල්ල-වග්ගයේ අවසාන ඛන්ධක දෙක සහ 'පරිවාරය' හැර) සම්පූර්ණ වූයේ විශාලා මහනුවර වූ සඞ්ගායනාවට ප්‍රථම යැ යි ඕල්ඩන්බ(ර්)ග් මහතා කියයි. ''දස කරුණු'' පිළිබඳ විවාදය විශාලා මහනුවර වූ සඞ්ගායනාව විස්තර කරන ආකාරයෙන් විනය පිටකයෙහි අගට යොද තිබීම එයට සාධකයක් බව ඔහු පෙන්වා දෙයි. පළමු සඞ්ගායනා දෙක පිළිබඳ විස්තර දක්වෙන චුල්ලවග්ගයේ අවසාන ඛන්ධක දෙක විශාලා මහනුවර සඞ්ගායනාවට පසුව ඇති වී යැ යි ඔහු දක්වයි.[1]

### පරිවාර

'පරිවාර' නොහොත් 'පරිවාරපාඨ' විනය පිටකයට අවසාන වශයෙන් ඇතුළත් වූ ග්‍රන්ථය වේ. විනය

---

[1] චුල්ලවග්ගයේ එකොළොස්වැනි ඛන්ධකයෙහි දක්වෙන ප්‍රථම සඞ්ගායනාව පිළිබඳ විස්තරය ප්‍රථම සඞ්ගායනාව වූ කාලයෙහිදීම ඇති වී යැ යි සිතීම වැරදි බව බී. සී. ලෝ මහතාද කියයි.

පිටකයට පමණක් නොව මුළු ත්‍රිපිටකයටම පසුවම ඇතුළත් වූ ග්‍රන්ථය 'පරිවාර' හැටියට සැලකිය හැකිය. මෙය, තෙවැනි සඞ්ගායනාවෙන් පසුව ජම්බුදීපයෙහි සිට ලංකාවට පැමිණි මහින්ද තෙරුන්වහන්සේ විසින් ලාංකිකයින්ට (අනිකුත්) විනය ග්‍රන්ථයන් ද, නිකාය පසද, අභිධර්ම ග්‍රන්ථ සතද, දෙශනා කරන ලද බව පරිවාරපාඨයෙහි සඳහන් වී තිබීමෙන්[1] මැනවින් සනාථ වේ. ග්‍රන්ථවාසානයෙහි දක්වෙන පරිදි, ලක්දිව මහා නුවණැති උගත්, දක්ෂ දීප විසින් පෙර ඇදුරන් ගත් මග තැනින් තැන විමසා විනය හදරණවුන්ගේ ප්‍රයෝජනය පිණිස ලියන ලද[2] මේ ග්‍රන්ථය ලංකාවෙහිදී ග්‍රන්ථාරූඪ කළ බව මහින්ද තෙරුන් වහන්සේද, එතුමාගේ ශ්‍රාවකයින්ද, ලක්දිව වීසූ ඒ ශ්‍රාවකයින්ගේ ශ්‍රාවකයින්ද විනය පිටකය දෙශනා කිරීමෙන් පසුව 'පරිවාර' ග්‍රන්ථය ලියූ බවට සාධක ග්‍රන්ථයෙහි ම සඳහන් වීමෙන් පැහැදිලි වේ. පරිවාරපාඨයෙහි සඳහන් මේ ශ්‍රාවක-

---

1 පරි. 2–3 පිටුවෙහි—
උපාලි දසකො චෙව සොනකො සිග්ගවො තථා
මොග්ගලිපුත්තෙන පඤ්චමා එතෙ ජම්බුසිරිව්හයෙ.
තතො මහින්දෙ ඉඩියො උත්තියො සම්බලො තථා භද්දනාමො ච පණ්ඩිතො
එතෙ නාගා මහාප්‍රඤ්ඤා ජම්බුදීපා ඉධාගතා,
විනයං තෙ වාචයිංසු පිටකං තම්බපණ්ණියා.
නිකායෙ පඤ්ච වාචෙසුං සත්ත චෙව පකාරණෙ.

2 පරි. 226 වෙනි පිටුවෙහි—
පුබ්බාචරියමග්ගඤ්ච පුච්ඡිත්වා'ච තහිං තහිං
දීපනාමො මහාපඤ්ඤෙ සුතධරො විචක්ඛණො,
ඉමං විත්ථාරසංඛෙපං සජ්ඣාමග්ගෙන මජ්ඣිමෙ
චින්තයිත්වා ලිඛාපෙසි සිස්සකානං [illegible]වහං.

යින්ගේ නාම ලේඛනය අනුව[1] මේ ග්‍රන්ථය වළගම්බා රජුගේ රාජ්‍ය සමයට බොහෝ ඈත් නොවූ කාලයක ග්‍රන්ථාරූඪ කරන ලද්දක් බව සැලකිය හැකි ය. බී. සී. ලෝ මහතා අදහස් කරන පරිදි, වළගම්බා රජුගේ රාජ්‍ය සමයෙහි වූ සඞ්ගායනාවෙහිදී 'පරිවාර' ග්‍රන්ථය ත්‍රිපිටකයට ඇතුලත් කරන්නට ඇත. මෙයින් අද අප අතර ඇති විනය පිටකය සම්පූර්ණ විය.

1 10 වැනි පිටුවෙහි 1 වැනි අධෝ ලිපිය බලන්න,

# 1. සුත්තවිභඞ්ග

'සුත්ත' යනු සංස්කෘත 'සූත්‍ර' යන පදයෙන් සිද්ධ වූවකි. එය නූලට ද, ධර්ම කොට්ඨාසයට ද, ව්‍යවස්ථා වට ද නමකි. එහෙත් මෙහි 'සුත්ත' යනුවෙන් හඳුන්වනුයේ 'ව්‍යවස්ථාව'[1] ය. 'විභඞ්ග' යනුවෙන් හඳුන්වනුයේ 'විභාගකිරීම'ය. එනම්, ප්‍රභෙද වශයෙන් පරීක්ෂා කිරීම ය. 'සුත්ත' සහ 'විභඞ්ග' යන නම් දෙක සමාස වශයෙන් එකතුවීමෙන් 'සුත්තවිභඞ්ග' නාමය සිද්ධ වේ. සුත්තවල විභඞ්ගය 'සුත්තවිභඞ්ග' නම්. නැතහොත් සුත්ත පිළිබඳ විභඞ්ගය 'සුත්තවිභඞ්ග'යි. එනම්, ව්‍යවස්ථාවල හෝ ව්‍යවස්ථා පිළිබඳ හෝ විභාග කිරීම 'සුත්තවිභඞ්ග' වේ.

සුත්තවිභඞ්ගයෙහි 'භික්ඛුවිභඞ්ග' සහ 'භික්ඛුණී විභඞ්ග' යනුවෙන් කොටස් දෙකක් වේ. 'මහාවිභඞ්ග' යනුද භික්ඛුවිභඞ්ගයට තවත් නමකි. එහි පාතිමොක්ඛය පිළිබඳ — එනම්, භික්ෂුශීලය පිළිබඳ — සූත්‍ර (ව්‍යවස්ථා) දැක්වේ. මීට උපමිතිව භික්ෂුණීයන්ගේ ශීලය පිළිබඳව සූත්‍ර දක්වන ග්‍රන්ථය 'භික්ඛුණීවිභඞ්ග' නම්. එය භික්ඛුවිභඞ්ගයට කළ කෙටි අටුවාවකට සමාන ය.

---

[1] උභයානි ඛො පනස්ස පාතිමොක්ඛානි විත්ථාරෙන න ස්වාගතානි හොන්ති, න සුවිභත්තානි, න සුප්පවත්තීනි, න සුවිනිච්ඡිතානි **සුත්තතො** (සූත්‍රයෙන් සූත්‍රය — ව්‍යවස්ථාවෙන් ව්‍යවස්ථාව) අනුව්‍යඤ්ජනසො— ම. ව. I 36.13; 37.13.
ඉදනෙව ඛො මයං ජානාම අයම්පි කිර ධම්මො **සුත්තාගතො** (සූත්‍රගත — ව්‍යවස්ථාගත) සුත්තපරියාපන්නො අන්වද්ධමාසං උද්දෙසං ආගච්ඡතීති— චූ. ව. III 34.2.

## I. භික්ඛුවිභඞ්ග

භික්ඛුවිභඞ්ගයෙහි සාරය පාතිමොක්ඛය හෙවත් භික්ෂු ශීලය වේ. එහි සෑම පාතිමොක්ඛ සූත්‍රයක්ම මැනවින් විස්තර කර ඇත. එහි ප්‍රථමයෙන්ම විස්තර කරනුයේ සඳහන් වන සූත්‍රය ඇතිවූ පිළිවෙලත්, එය ඇතිවීමට හේතුවූ දැත් ය. මේ ඓතිහාසික හැඳින්වීමෙන් පසුව පාතිමොක්ඛ සූත්‍රය සඳහන් වේ. මෙය බොහෝ විට සඳහන්වනුයේ සූත්‍රය (ව්‍යවස්ථාව නොහොත් ශික්ෂා-පදය) කඩකිරීමෙන් ලැබෙන ආදීනව දක්වමිනි. මීළඟට දක්වෙනුයේ 'පදභාජනිය'ය. මෙය සඳහන් කළ සූත්‍රයේ වචනයක් වචනයක් පාසා විභාග කෙරෙන පැරණි අටුවාවකි. පදභාජනියට පසුව දක්වෙනුයේ සඳහන් කළ සූත්‍රය තව තවත් විස්තර කෙරෙන සහ එහි සැක ස්ථානයන් විභාග කෙරෙන කථාවස්තූන් ය. මේ කථාවස්තු සමහර අවස්ථාවන්හි පදභාජනියට ප්‍රථම-යෙන් සඳහන් වේ. එසේම සමහර අවස්ථාවන්හි මේ කථාවස්තු දක්නට නොලැබේ.

මෙසේ විස්තර වෙන සූත්‍ර දෙසිය විසි හතකින් යුත් භික්ඛුවිභඞ්ගය **'පාරාජික'** සහ 'පාචිත්තිය' යනුවෙන් කොටස් දෙකකින් යුක්ත ය. අකුසළ ද ප්‍රධාන වශයෙන් මේ කොටස් දෙක අනුව බෙදූ ඇත. පාරාජික අකුසළ හේතු කොට ගෙන භික්ෂුභාවය-නැසීම සිදුවේ. එහෙත් පාචිත්තිය අකුසළයන් සමාකර ගැනීමට නොහොත් නැති කර ගැනීමට ක්‍රම ඇත. 'පාරාජික' සහ 'පාචිත්තිය' යන කොටස් දෙකෙහි දක්වෙන සූත්‍ර දෙසිය විසි හත කාණ්ඩ අටකට බෙදූ ඇත. එනම්—පාරාජිකා, සඞ්ඝාදිසෙස, අනියත, නිස්සග්ගිය පාචිත්තිය, පාචිත්තිය,

පටිදෙසනිය, සෙඛිය සහ අධිකරණ-සමථ යනු ය.[1] සූත්‍ර දෙසිය විසි-හතෙන් හතරක් පාරාජික සූත්‍ර වේ; දහතුනක් සඞ්ඝාදිසෙස සූත්‍ර වේ; දෙකක් අනියත සූත්‍ර වේ; තිහක් නිස්සග්ගිය පාචිත්තිය සූත්‍ර වේ; දෙඅනූවක් පාචිත්තිය සූත්‍ර වේ; හතරක් පටිදෙසනිය සූත්‍ර වේ; සැත්තෑ-පහක් සෙඛිය සූත්‍ර වේ; හතක් අධිකරණ-සමථ සූත්‍ර වේ. මේ සූත්‍ර සියල්ලම පිළිබඳ ලුහුඬු විස්තරයක් මතු දැක්වෙන පාතිමොක්ඛ විස්තරයෙහි සඳහන් වේ.

පාතිමොක්ඛ සූත්‍ර භික්ඛුවිභඞ්ගයෙහි සාරය වුවත් පාතිමොක්ඛයෙහි නිදන කථාවස්තුව[2] සඳහන්වනුයේ මහාවග්ගයෙහි ය. අඩ මසකට වරක් උපොසථ දිනයෙහි පැවැත්වෙන සංඝ සභාවෙහි පාතිමොක්ඛ උදෙසීම පැවැත්වෙන බව එහි සඳහන් වේ. දැනුම් දෙන ලද උපොසථ දිනයෙහි සංඝයා රැස් වූ විට සංඝ සභා-වෙහි මුලසුන දරන භික්ෂුව විසින් පාතිමොක්ඛය ආරම්භ කිරීම පිණිස එහි නිදන කථාවස්තුව කියවේ. අනතුරුව කොටස් අටකට බෙදා තිබෙන සූත්‍ර-දෙසිය විසි හත උදෙසීම ආරම්භ වේ.

## 1. පාරාජිකා සූත්‍ර සතර

1. යම් පැවිද්දකු කිසියම් විලසකින් මෛථුන්දම් සේවනය කිරීම පරිජිවීමකි. (1)
2. යම් පැවිද්දකු කිසියම් දෙයක් සොර සිතින් ගැනීම පරිජිවීමකි. (2)

---

[1] මුල් කාණ්ඩ හතර 'පාරාජිකා' කොටසට ද, අග කාණ්ඩ හතර 'පාචිත්තිය' කොටසට ද ඇතුළත් වේ.

[2] ම. ව. II. 3.3—මෙහි මතු දැක්වේ.

1. විනය-සු.වි. පාරාජිකා i 7
2. ,, සු.වි. ,, ii 2

3. යම් පැවිද්දකු මිනිසකුගේ දිවි තොර කිරීමට කිසියම් විලසකින් දැනුවත්ව ආධාර කිරීම පරිජිවීමකි. (3)

4. යම් පැවිද්දකු තමා වෙත උත්තර මනුෂ්‍ය ධර්මයන් ඇතැ යි පුරසාරම් දෙඩීම පරිජිවීමකි. (4)

## 2. සඞ්ඝාදිසෙස සූත්‍ර දහතුන

5. යම් පැවිද්දකු සිනෙන් හැර වෙන අන් ක්‍රමයකින් ශුක්‍ර මෝචනය කිරීම සඞ්ඝාදිසෙසයකි. (1)

6. යම් පැවිද්දකු දූෂිත සිතින් ස්ත්‍රියක ස්පර්ශ කිරීම සඞ්ඝාදිසෙසයකි. (2)

7. යම් පැවිද්දකු ස්ත්‍රියක සමග කාමුක අදහස්වලට ඉවහල් වන කථාවක යෙදීම සඞ්ඝාදිසෙසයකි. (3)

8. යම් පැවිද්දකු ''මට මෛථුන ධර්මයෙන් උපස්ථාන කරව'' යි කීම සඞ්ඝාදිසෙසයකි. (4)

9. යම් පැවිද්දකු ස්ත්‍රී පුරුෂ දෙදෙනකුගේ සම්බන්ධයක් ඇති කිරීම සඞ්ඝාදිසෙසයකි. (5)

10. යම් පැවිද්දකු දයකයකු නොමැතිව, තමාගේම වාසයට වෙනත් භික්ෂූන්ගේ අනුදැනීමක් නැතුව හෝ ප්‍රාණයන්ට අනතුරු සහිතව හෝ සුගත් වියතින් දිග දෙළොස් වියතකටද පළල සත් වියතකටද වැඩි ස්ථානයක් ගෙන හෝ කුටියක් කිරීම සඞ්ඝාදිසෙසයකි. (6)

---

| | | | | |
|---|---|---|---|---|
| 3. | විනය- | සු.වි. | පාරාජිකා | iii 2 |
| 4. | ,, | සු.වි. | ,, | iv 2 |
| 5. | ,, | සු.වි. | සඞ්ඝාදිසෙස | i 2. 1 |
| 6. | ,, | සු.වි. | ,, | ii 1. 2 |
| 7. | ,, | සු.වි. | ,, | iii 1. 2 |
| 8. | ,, | සු.වි. | ,, | iv 1. 2 |
| 9. | ,, | සු.වි. | ,, | v 2. 2 |
| 10. | ,, | සු.වි. | ,, | vi 1. 6 |

11. යම් පැවිද්දකු විශාල ඉඩමක, දයකයකු නොමැතිව, තමාගේ සහ අවනත් භික්ෂූන්ගේ වාසයට භික්ෂූන්ගේ අනුදැනිමක් නොමැතිව හෝ ප්‍රාණයන්ට අනතුරු සහිතව හෝ විහාරයක් කිරීම සඞ්ඝාදිසෙසයකි. (7)

12. යම් පැවිද්දකු උපසපන් මහණකුට පාරාජිකාවකින් චෝදනා කිරීම සඞ්ඝාදිසෙසයකි. (8)

13. යම් පැවිද්දකු නොනිසි තර්ක ඉදිරිපත් කරමින් උපසපන් මහණකුට පාරාජිකාවකින් චෝදනා කිරීම සඞ්ඝා-දිසෙසයකි. (9)

14. යම් පැවිද්දකු සඞ්ඝ භෙදය ඇති කිරීම සඞ්ඝාදිසෙසයකි. (10)

15. යම් පැවිද්දකු සඞ්ඝ භෙදය ඇති කරන පැවිද්දට ආධාර දීම සඞ්ඝාදිසෙසයකි. (11)

16. යම් පැවිද්දකු ප්‍රාතිමොක්ෂ දෙශනයෙහි දූර්වච බව පහළ කිරීම සඞ්ඝාදිසෙසයකි. (12)

17. යම් පැවිද්දකු තමා විසින් දූෂිත කරන ලද ප්‍රදේශයෙන් නික්-මීමට, සඞ්ඝයා විධාන කළ විට එම විධානය නොපිළිපැදීම සඞ්ඝාදිසෙසයකි. (13)

## 3. අනියත සූත්‍ර දෙක

18. යම් පැවිද්දකු ස්ත්‍රියක සමග මෙවුන්දම් සේවනයට සුදුසු ආස-නයක සිටීම දුටු උපාසිකාවකට පාරාජිකාවෙන් හෝ සඞ්ඝා-දිසෙසයෙන් හෝ පාචිත්තියෙන් හෝ ඒ පැවිද්දට චෝදනා කළ හැකි ය.— එය අනියත ය. (1)

---

| | | | | |
|---|---|---|---|---|
| 11. | විනය-සු.වි. | සඞ්ඝාදිසෙස | vii 1 |
| 12. | ,, සු.වි. | ,, | viii 1. 9 |
| 13. | ,, සු.වි. | ,, | ix 1. 2 |
| 14. | ,, සු.වි. | ,, | x 1. 3 |
| 15. | ,, සු.වි. | ,, | xi 1 |
| 16. | ,, සු.වි. | ,, | xii 1 |
| 17. | ,, සු.වි. | ,, | xiii 1. 8 |
| 18. | ,, සු.වි. | අනියත | i 1 |

19. යම් පැවිද්දකු ස්ත්‍රියක සමග අසභ්‍ය තෙපුල් තෙපුලන්නට සුදුසු ආසනයක සිටීම දුටු උපාසිකාවකට සඞඝාදිසෙසයෙන් හෝ පාචිත්තියෙන් හෝ ඒ පැවිද්දට චෝදනා කළ හැකි ය.— එය අනියත ය. (2)

## 4. නිස්සග්ගිය පාචිත්තිය සූත්‍ර තිහ

### i. චීවර වග්ග

20. යම් පැවිද්දකු සිවුරක් අතිරේක වශයෙන් දස දිනකට වඩා කල් තබා ගැනීම නිසඟි පචිතියකි. (1)
21. යම් පැවිද්දකු තුන් සිවුරු නොමැතිව එක් රැයකුදු සිටීම නිසඟි පචිතියකි. (2)
22. යම් පැවිද්දකු අකාලයෙහි ලත් සිවුරු මසකට වඩා කල් පරිහරණය කිරීම නිසඟි පචිතියකි. (3)
23. යම් පැවිද්දකු ඥාති නොවූ භික්ෂුණියක ලවා සිවුරු සේදවීම නිසඟි පචිතියකි. (4)
24. යම් පැවිද්දකු ඥාති නොවූ භික්ෂුණියකගේ අතින් සිවුරු පිළිගැනීම නිසඟි පචිතියකි. (5)
25. යම් පැවිද්දකු ඥාති නොවූ ගෘහපතීන්ගෙන් අකාලයෙහි සිවුරු ඉල්ලීම නිසඟි පචිතියකි. (6)
26. යම් පැවිද්දකු ගෘහපතීන් විසින් පිළිගැනීමට ඉදිරිපත් කරන ලද සිවුරු නිසි ප්‍රමාණයට වැඩියෙන් පිළියෙල කර ගැනීම නිසඟි පචිතියකි. (7)

---

| | | | | | |
|---|---|---|---|---|---|
| 19. | විනය– | සු.වි. | අනියත | | ii 1. |
| 20. | ,, | සු.වි. | නිස්සග්ගිය | පාචිත්තිය | i 2 |
| 21. | ,, | සු.වි. | ,, | ,, | ii 2 |
| 22. | ,, | සු.වි. | ,, | ,, | iii 1.2 |
| 23. | ,, | සු.වි. | ,, | ,, | iv 1 |
| 24. | ,, | සු.වි. | ,, | ,, | v 2 |
| 25. | ,, | සු.වි. | ,, | ,, | vi 2 |
| 26. | ,, | සු.වි. | ,, | ,, | vii 1 |

27. යම් පැවිද්දකු ඥාති නොවූ ගෘහපතින් විසින් පැවරීමට අදහස් කරන ලද සිවුරු විකල්පනය කිරීම නිසඟි පචිතියකි. (8)

28. යම් පැවිද්දකු ගෘහපතින් දෙදෙනකු විසින් පිළිගැන්වීමට අදහස් කරන ලද සිවුරු දෙක වෙනුවට වඩා හොඳ එක සිවුරක් පිළියෙල කරන්නට යැ යි කීම නිසඟි පචිතියකි. (9)

29. යම් පැවිද්දකු තම දායකයා සිවුරක් පිණිස යමකුගෙන් බාරගත් මුදලෙන් එම සිවුර ගෙන දීම අතපසු කළ විට එය ගෙන දීමට දායකයාට තෙවරකට වඩා කීම මෙන්ම එය ගෙන දීම දායකයාට මතක් කිරීම පිණිස ඔහු ඉදිරියෙහි සය වරකට වඩා පෙනී සිටීම ද නිසඟි පචිතියකි. (10)

## ii. කොසෙය්‍ය වග්ග

30. යම් පැවිද්දකු කොසෙය්‍ය නොහොත් පට මිශ්‍ර කොට ඇතිරිල්ලක් කිරීම නිසඟි පචිතියකි. (11)

31. යම් පැවිද්දකු හුදු කලු එළු ලොමින් ඇතිරිල්ලක් කිරීම නිසඟි පචිතියකි. (12)

32. යම් පැවිද්දකු ඇතිරිල්ලකට අවශ්‍ය ලොම්වලින් දෙකෙන් කොටසක් කලු එළු ලොම් ද, හතරෙන් කොටසක් සුදු ලොම් ද, ඉතිරි හතරෙන් කොටසට පිඟුවන් ලොම් ද, නොගෙන ඇතිරිල්ලක් කිරීම නිසඟි පචිතියකි. (13)

33. යම් පැවිද්දකු ඇතිරිල්ලක් කොට අවුරුදු සයක් යෑමට මත්තෙන් අනිකුත් භික්ෂූන්ගෙන් අවසර නොගෙන නව ඇතිරිල්ලක් කිරීම නිසඟි පචිතියකි. (14)

---

| | | | | | |
|---|---|---|---|---|---|
| 27. | විනය-සු.වි. | | නිස්සග්ගිය පාචිත්තිය | | viii 1 |
| 28. | ,, | සු.වි. | ,, | ,, | ix 1 |
| 29. | ,, | සු.වි. | ,, | ,, | x 1.3 |
| 30. | ,, | සු වි. | ,, | ,, | xi 1 |
| 31. | ,, | සු.වි. | ,, | ,, | xii 1 |
| 32. | ,, | සු.වි. | ,, | ,, | xiii 1 |
| 33. | ,, | සු.වි. | ,, | ,, | xiv 2 |

34. යම් පැවිද්දකු පරණ ඇතිරිල්ලෙන් වියතක පමණ තීරයක් වට-යට නොයොද අලුත් ඇතිරිල්ලක් සෑදීම නිසඟි පචිතියකි. (15)

35. යම් පැවිද්දකු ගමනෙහි දි ලත් ඇතිරිල්ලක් තුන් යොදුනක් ඉක්මවා ගෙන යෑම නිසඟි පචිතියකි. (16)

36. යම් පැවිද්දකු ඥාති නොවූ භික්ෂුණියක ලවා ඇතිරිල්ලක් පිළි-යෙල කර ගැනීම නිසඟි පචිතියකි. (17)

37. යම් පැවිද්දකු රන් රිදී ආදිය පිළිගැන්ම මෙන්ම එය පිළිගැන්ම අන් අයකුට පැවරීම ද, තම ප්‍රයෝජනය පිණිස එය එකතුවීමට ඉඩ හැරීම ද යන සැමෙකක්ම නිසඟි පචිතියකි. (18)

38. යම් පැවිද්දකු රන් රිදී ආදියෙන් ගනුදෙනුවක් කිරීම නිසඟි පචිතියකි. (19)

39. යම් පැවිද්දකු කිසියම් වෙළඳ ව්‍යාපාරයක යෙදීම නිසඟි පචිතියකි. (20)

**iii. පාත්‍ර වග්ග**

40. යම් පැවිද්දකු පාත්‍රයක් අතිරේක වශයෙන් දස දිනකට වඩා කල් තබා ගැනීම නිසඟි පචිතියකි. (21)

41. යම් පැවිද්දකු පිළියම් පහකට අඩු පාත්‍රයක් ඇති කල්හි ඒ වෙනුවට අලුත් පාත්‍රයක් ගැනීම නිසගි පචිතියකි. (22)

42. යම් පැවිද්දකු ලැබුණා වූ පංච විධි ඖෂධ සත් දිනකට වඩා කල් තබා ගැනීම නිසගි පචිතියකි. (23)

---

| | | | | | |
|---|---|---|---|---|---|
| 34. | විනය- | සු.වි. | නිස්සග්ගිය | පාචිත්තිය | xv 1.3 |
| 35. | ,, | සු.වි. | ,, | ,, | xvi 1 |
| 36. | ,, | සු.වි. | ,, | ,, | xvii 1 |
| 37. | ,, | සු.වි. | ,, | ,, | xviii 1 |
| 38. | ,, | සු.වි. | ,, | ,, | xix 1 |
| 39. | ,, | සු.වි. | ,, | ,, | xx 1 |
| 40. | ,, | සු.වි. | ,, | ,, | xxi 2 |
| 41. | ,, | සු.වි. | ,, | ,, | xxii 1.3 |
| 42. | ,, | සු.වි. | ,, | ,, | xxiii 1.3 |

43. යම් පැවිද්දකු ග්‍රීෂ්ම ඍතුව ගත වීමට මසකට වඩා කල් තිබියදී සියලු වැසි සිවුරු පිළියෙල කිරීම මෙන්ම ග්‍රීෂ්ම ඍතුව ගත වීමට අඩමසකට වඩා කල් තිබියදී වැසි සිවුරු පිළියෙල කර ඇඳීම ද නිසඟි පචිතියකි. (24)

44. යම් පැවිද්දකු සිත් අමනාපවීම නිසා තව පැවිද්දකුට දුන් සිවුරක් නැවත ගැනීම නිසඟි පචිතියකි. (25)

45. යම් පැවිද්දකු පෙහෙරන් ලවා තමාට සිවුරු වියවීම නිසඟි පචිතියකි. (26)

46. යම් පැවිද්දකු ගෘහපතීන් පෙහෙරන් ලවා වියවා දීමට අදහස් කළ සිවුරක් පිළිබඳව පෙහෙරන් කරා පැමිණ විකල්පනය කිරීම නිසඟි පචිතියකි. (27)

47. යම් පැවිද්දකු පවාරණයට දස දිනකට පෙර ලද සිවුරක් චීවර කාලයට පසුත් පරිහරණය කිරීම නිසඟි පචිතියකි. (28)

48. යම් පැවිද්දකු තුන් සිවුරෙන් එකක් ග්‍රාම කුටියෙහි තබා වනයෙහි වසන කාලය තුළ සය දිනකට වඩා සිවුරෙන් වෙන්ව විසීම නිසඟි පචිතියකි. (29)

49. යම් පැවිද්දකු සංඝයාට පිරිනමන ලද චීවරාදිය දැන දැන තමන්ට පිරිනමවා ගැනීම නිසඟි පචිතියකි. (30)

## 5. පාචිත්තිය සූත්‍ර දෙඅනුව

### i. මුසාවාද වග්ග

50. යම් පැවිද්දකු දැනුවත්ව බොරුකීම පචිතියකි. (1)

---

| | | | | | |
|---|---|---|---|---|---|
| 43. | විනය-සු.වි | නිස්සග්ගිය | පාචිත්තිය | xxiv 1 |
| 44. | ,, | සු.වි. | ,, | ,, | xxv 1 |
| 45. | ,, | සු.වි. | ,, | ,, | xxvi 1 |
| 46. | ,, | සු.වි. | ,, | ,, | xxvii 1 |
| 47. | ,, | සු.වි. | ,, | ,, | xxviii 1.2 |
| 48. | ,, | සු.වි. | ,, | ,, | xxix 1 |
| 49. | ,, | සු.වි. | ,, | ,, | xxx 1 |
| 50. | ,, | සු.වි. | පාචිත්තිය | | i 1 |

51. යම් පැවිද්දකු උපසපන් පැවිද්දකුට අපහාස කිරීම පචිතියකි. (2)

52. යම් පැවිද්දකු හිස් බස් තෙපුලීම පචිතියකි. (3)

53. යම් පැවිද්දකු උපසපන් නොවූ අයකු ලවා ධර්මය පදයෙන් පදය උදෙසීම පචිතියකි. (4)

54. යම් පැවිද්දකු උපසපන් නොවූ අයකු සමග දෙතුන් රැයකට වඩා සැතපීම පචිතියකි. (5)

55. යම් පැවිද්දකු ස්ත්‍රියක සමග සැතපීම පචිතියකි. (6)

56. යම් පැවිද්දකු පුරුෂයකු නොමැතිව ආ ස්ත්‍රියකට වචන පහකට හයකට වැඩියෙන් ධර්මය දේශනා කිරීම පචිතියකි. (7)

57. යම් පැවිද්දකු උපසපන් නොවූ අයකුට තමා හෝ වෙන පැවිද්දකු හෝ ලත් හෝ නොලත් හෝ උත්තර මනුෂ්‍ය ධර්මයක් පිළිබඳව විස්තර කිරීම පචිතියකි. (8)

58. යම් පැවිද්දකු උපසපන් නොවූ අයකුට පැවිද්දකුගේ දරුණු වරදක් කීම පචිතියකි. (9)

59. යම් පැවිද්දකු පොළව කැණීම මෙන්ම කැණවීමද පචිතියකි. (10)

## ii. භූතගාම වග්ග

60. යම් පැවිද්දකු තෘණ වෘක්ෂාදිය විනාශ කිරීම පචිතියකි. (11)

61. යම් පැවිද්දකු සංඝයා වෙහෙසවීම පචිතියකි. (12)

---

| | | | | |
|---|---|---|---|---|
| 51. | විනය-සු.වි. | | පාචිත්තිය | ii 1.2 |
| 52. | ,, | සු.වි. | ,, | iii 1 |
| 53. | ,, | සු.වි. | ,, | iv 1 |
| 54. | ,, | සු.වි. | ,, | v 1 |
| 55. | ,, | සු.වි. | ,, | vi 1 |
| 56. | ,, | සු.වි. | ,, | vii 3 |
| 57. | ,, | සු.වි. | ,, | viii 1.2 |
| 58. | ,, | සු.වි. | ,, | ix 1 |
| 59. | ,, | සු.වි. | ,, | x 1 |
| 60. | ,, | සු.වි. | ,, | xi 1 |
| 61. | ,, | සු.වි. | ,, | xii 2 |

62. යම් පැවිද්දකු භික්ෂූන්ගේ නුගුණ කීම පචිතියකි. (13)

63. යම් පැවිද්දකු සඟසතු ඇඳ පුටු ආදිය වීසුරුවා නැවත එය පිළි-වලට නොතබා හෝ එය පිළිවලට තැබීමට කිසිවකුට නොකියා හෝ නික්ම යෑම පචිතියකි. (14)

64. යම් පැවිද්දකු සඟසතු විහාරයෙහි ඇඳ පුටු ආදිය විසුරුවා නැවත එය පිළිවලට නොතබා හෝ එය පිළිවලට තැබීමට කිසිවකුට නොකියා හෝ නික්ම යෑම පචිතියකි. (15)

65. යම් පැවිද්දකු සඟසතු විහාරයෙහි වාසයට පළමු කොට පැමිණි පැවිද්දට හිරිහැර වන අන්දමින් එහි විසීම පචිතියකි. (16)

66. යම් පැවිද්දකු සඟසතු විහාරයෙන් අන් පැවිද්දකු නෙරපීම පචිතියකි. (17)

67. යම් පැවිද්දකු සඟසතු විහාර මහලෙහි ඇඳ පුටු ආදිමයෙහි නො-සැලකිලි අන්දමින් සැතපීම හා ඉඳීම පචිතියකි. (18)

68. යම් පැවිද්දකු දෙර ජනේලාදියෙහි කවුළුවල නිශ්චල බව පිණිස කවුළුවේ ප්‍රමාණය දෙතුන් ගුණයකින් ඉක්මවා මැටි ආදිය ගැසීම පචිතියකි. (19)

69. යම් පැවිද්දකු පණුවන් ඇති ජලය තෘණවලට හෝ මැටිවලට හෝ ඉසීම පචිතියකි. (20)

## iii. භික්ඛුනොවාද වග්ග

70. යම් පැවිද්දකු භික්ෂු සම්මුතියක් නොමැතිව භික්ෂුණීන්ට අවවාද කිරීම පචිතියකි. (21)

---

| | | | | |
|---|---|---|---|---|
| 62. | විනය- | සු.වි. | පාචිත්තිය | xiii 2 |
| 63. | ,, | සු.වි. | ,, | xiv 1.1 |
| 64. | ,, | සු.වි. | ,, | xv 1 |
| 65. | ,, | සු.වි. | ,, | xvi 1 |
| 66. | ,, | සු.වි. | ,, | xvii 1 |
| 67. | ,, | සු.වි. | ,, | xviii 1 |
| 68. | ,, | සු.වි. | ,, | xix 1 |
| 69 | ,, | සු.වි. | ,, | xx 1 |
| 70. | ,, | සු.වි. | ,, | xxi 1 |

71. යම් පැවිද්දකු භික්ෂු සම්මුතිය ලද්ද හිරු අවරට ගිය කළ භික්ෂු- ණියන්ට අවවාද කිරීම පචිතියකි. (22)

72. යම් පැවිද්දකු නොනිසි අවස්ථාවන්හි මෙහෙණවරකට එළඹ අවවාද කිරීම පචිතියකි. (23)

73. යම් පැවිද්දකු ආමිස ආශාවෙන් භික්ෂුණියන්ට අවවාද කිරීම පචිතියකි. (24)

74. යම් පැවිද්දකු ඤාති නොවූ භික්ෂුණියකට සිවුරක් දීම පචිතියකි. (25)

75. යම් පැවිද්දකු ඤාති නොවූ භික්ෂුණියකට සිවුරක් පිළියෙල කර දීම මෙන් ම පිළියෙල කරවා දීම ද පචිතියකි. (26)

76. යම් පැවිද්දකු භික්ෂුණියක සමග කථිකාකොට ගමනක යෙදීම පචිතියකි. (27)

77. යම් පැවිද්දකු එතරට තරණය කිරීමට හැර වෙන කරුණක් උදෙසා භික්ෂුණියක සමග එක නැවක යාත්‍රා කිරීම පචිතියකි.(28)

78. යම් පැවිද්දකු භික්ෂුණියක විසින් පිළියෙල කරන ලද භෝජ- නයක් දැනුවත්ව වැළඳීම පචිතියකි. (29)

79. යම් පැවිද්දකු භික්ෂුණියක සමග රහසිගතව නිසජ්ජා කිරීම පචිතියකි. (30)

### iv. භොජන වග්ග

80. යම් පැවිද්දකු නොගිලන්ව සිටියදී දවසකට වරකට වඩා භොජන ගැනීම පචිතියකි. (31)

---

| | | | | |
|---|---|---|---|---|
| 71. | විනය- | සු.වි. | පාචිත්තිය | xxii 1 |
| 72. | ,, | සු.වි. | ,, | xxiii 2 |
| 73. | ,, | සු.වි. | ,, | xxiv 1 |
| 74. | ,, | සු.වි. | ,, | xxv 2 |
| 75. | ,, | සු.වි. | ,, | xxvi 1 |
| 76. | ,, | සු.වි. | ,, | xxvii 2 |
| 77. | ,, | සු.වි. | ,, | xxviii 2 |
| 78. | ,, | සු.වි. | ,, | xxix 2 |
| 79. | ,, | සු.වි. | ,, | xxx 1 |
| 80. | ,, | සු.වි. | ,, | xxxi 2 |

81. නිසි අවස්ථාවන්හි හැර, අන් අවස්ථාවන්හි භොජන පිණිස සමූහයක් වශයෙන් යෑම පචිතියකි. (32)
82. යම් පැවිද්දකු පැවරූ පිළිවෙල ඉක්මවා උත්තපටිපාටියෙන් වැළඳීම පචිතියකි. (33)
83. යම් පැවිද්දකු පැණි රස දෑ රුචිලෙස ගැනීමට අවස්ථාවක් ලත් විට පිරූ දෙතුන් පාත්‍රයකට වඩා එය ගැනීම පචිතියකි. (34)
84. යම් පැවිද්දකු වළඳා නිමවූවායින් පසු නැවතත් (වළඳා ඉතිරි දෑය නොවූවත්) වැළඳීම පචිතියකි. (35)
85. යම් පැවිද්දකු තව පැවිද්දකු තුළ ගිජුකම ඇති කිරීම පිණිස වළඳා නිමවූවායින් පසු නැවතත් 'මහණ, අනුභව කරව'යි යනුවෙන් වැළඳීමට ආරාධනා කිරීම පචිතියකි. (36)
86. යම් පැවිද්දකු විකාලයෙහි වැළඳීම පචිතියකි. (37)
87. යම් පැවිද්දකු පිළිගත් දෑය එක් රැයකුදු ඉක්මවා වැළඳීම පචිතියකි. (38)
88. යම් පැවිද්දකු නොගිලන්ව සිටියදී පස් බෙහෙත් ඉල්ලා වැළඳීම පචිතියකි. (39)
89. යම් පැවිද්දකු නොපිළිගන්වන ආහාරයක් වැළඳීම පචිතියකි. (40)

## v. අචෙලක වග්ග

90. යම් පැවිද්දකු අචෙලකයකුට හෝ පරිබ්‍රාජකයකුට හෝ කෑ යුතු දෙයක් සියතින් දීම පචිතියකි. (41)

---

| | | | | |
|---|---|---|---|---|
| 81. | විනය- | සු.වි. | පාචිත්තිය | xxxii 8 |
| 82. | ,, | සු.වි. | ,, | xxxiii 3 |
| 83. | ,, | සු.වි. | ,, | xxxiv 1.2 |
| 84. | ,, | සු.වි. | ,, | xxxv 2 |
| 85. | ,, | සු.වි. | ,, | xxxvi 1 |
| 86. | ,, | සු.වි. | ,, | xxxvii 1 |
| 87. | ,, | සු.වි. | ,, | xxxviii 1 |
| 88. | ,, | සු.වි. | ,, | xxxix 2 |
| 89. | ,, | සු.වි. | ,, | xl 2 |
| 90. | ,, | සු.වි. | ,, | xli 1.2 |

91. යම් පැවිද්දකු 'ඇවැත්නි, තා සමග හැසිරීම මට රුචි නැත. පහව යව' යනුවෙන් තව පැවිද්දකුට කීම පචිතියකි. (42)

92. යම් පැවිද්දකු රාගික ස්ත්‍රී පුරුෂයන්ගෙන් යුත් නිවසකට ඇතුල්වීම පචිතියකි. (43)

93. යම් පැවිද්දකු රහස් ස්ථානයක ස්ත්‍රියක සමග අසුන් ගැනීම පචිතියකි. (44)

94. යම් පැවිද්දකු ස්ත්‍රියක සමග තනිව අසුන් ගැනීම පචිතියකි.(45)

95. යම් පැවිද්දකු සද්ධිවිහාරකයාට නොකියා පිඩු සිගා ගම් වැදීම පචිතියකි. (46)

96. යම් පැවිද්දකු අගිලන්ව සිටියදී ගිලන් පසින් පැවරීම සාරමසක් ඉවසිය හැකි නමුත් නැවත ආරාධනාවක් නොමැතිව එය ඊට වැඩි කල් ඉවසීම පචිතියකි. (47)

97. යම් පැවිද්දකු යුද්ධ හමුදවක් බැලීමට යෑම පචිතියකි. (48)

98. යම් පැවිද්දකු යම්කිසි උවමනාවකට යුද්ධ හමුදවකට ගොස් එහි දෙතුන් රැයකට වඩා නතරවීම පචිතියකි. (49)

99. යම් පැවිද්දකු යුද්ධ හමුදවෙහි ගත කරන දෙතුන් රැය තුළ හමුදවෙහි වෙනත් දර්ශණයන් නැරඹීමට යෑම පචිතියකි. (50)

**vi. සුරාපාන වග්ග**

100. යම් පැවිද්දකු සුරා පානය කිරීම පචිතියකි. (51)

---

| | | | | |
|---|---|---|---|---|
| 91. | විනය- | සු.වි. | පාචිත්තිය | xlii 1 |
| 92. | ,, | සු.වි. | ,, | xliii 1 |
| 93. | ,, | සු.වි. | ,, | xliv 1 |
| 94. | ,, | සු.වි. | ,, | xlv 1 |
| 95. | ,, | සු.වි. | ,, | xlvi 5 |
| 96. | ,, | සු.වි. | ,, | xlvii 1.4 |
| 97. | ,, | සු.වි. | ,, | xlviii 2 |
| 98. | ,, | සු.වි. | ,, | xlix 1 |
| 99. | ,, | සු.වි. | ,, | l 1 |
| 100. | ,, | සු.වි. | ,, | li 1 |

101. යම් පැවිද්දකු තව කෙනකු ඇඟිල්ලෙන් ගිරිති කැවීම පචිතියකි. (52)

102. යම් පැවිද්දකු ජල ක්‍රීඩාවෙහි යෙදීම පචිතියකි. (53)

103. යම් පැවිද්දකු අනාදරයවීම පචිතියකි. (54)

104. යම් පැවිද්දකු තව පැවිද්දකු බියපත් කිරීම පචිතියකි. (55)

105. යම් පැවිද්දකු අගිලන්ව සිටියදී ගිනි තැපීම පිණිස ගිනි දල්වීම පචිතියකි. (56)

106. යම් පැවිද්දකු නියමිත කාලය තුළ හැර අන් අවස්ථාවන්හි අඩ මසක් ගතවීමට මත්තෙන් නෑම පචිතියකි. (57)

107. යම් පැවිද්දකු අලුත් සිවුරක් කප්බින්දු නොතබා පෙරවීම පචිතියකි. (58)

108. යම් පැවිද්දකු විකල්පනය කළ සිවුරක් නැවත පරිභොග කිරීම පචිතියකි. (59)

109. යම් පැවිද්දකු විහිළුවටවත් පාසිවුරු සැඟවීම පචිතියකි. (60)

## vii. සප්පාතක වග්ග

110. යම් පැවිද්දකු දැනුවත්ව ප්‍රාණයක් හානි කිරීම පචිතියකි. (61)

111. යම් පැවිද්දකු දැනුවත්ව ප්‍රාණයන් ඇති ජලය පානය කිරීම පචිතියකි. (62)

---

| | | | | |
|---|---|---|---|---|
| 101. | විනය- | සු.වි. | පාචිත්තිය | lii 1 |
| 102. | ,, | සු.වි. | ,, | liii 1 |
| 103. | ,, | සු.වි. | ,, | liv 1 |
| 104. | ,, | සු.වි. | ,, | lv 1 |
| 105. | ,. | සු.වි. | ,, | lvi 2 |
| 106. | ,, | සු.වි. | ,, | lvii 6 |
| 107. | ,, | සු.වි. | ,, | lviii 1 |
| 108. | ,, | සු.වි. | ,, | lix 1 |
| 109. | ,, | සු.වි. | ,, | lx 1 |
| 110. | ,, | සු.වි. | ,, | lxi 1 |
| 111. | ,, | සු.වි. | ,, | lxii 1 |

112. යම් පැවිද්දකු දැනුවත්ව ධර්මානුකූල තීරණයක් උල්ලඞ්ගනය කිරීම පචිත්තියකි. (63)

113. යම් පැවිද්දකු දැනුවත්ව වෙනත් පැවිද්දකුගේ වරදක් සැඟවීම පචිත්තියකි. (64)

114. යම් පැවිද්දකු දැනුවත්ව විසි වයස් සම්පූර්ණ නොවූවකු පැවිදි කිරීම පචිත්තියකි. (65)

115. යම් පැවිද්දකු සොරුන් බව දැනගනත් ඔවුන් සමග කථිකා- කොට ගමනක යෙදීම පචිත්තියකි. (66)

116. යම් පැවිද්දකු ස්ත්‍රියක සමග ගමනක යෙදීම පචිත්තියකි. (67)

117. යම් පැවිද්දකු බුද්ධ-දෙශනයන්ට අගෞරව වන අන්දමින් කථා කිරීම පචිත්තියකි. (68)

118. යම් පැවිද්දකු බුද්ධ-දෙශනයන්ට අගෞරව වන අන්දමින් කථා කරන පැවිද්දකු සමග දැනුවත්ව ආශ්‍රය කිරීම පචිත්තියකි. (69)

119. යම් පැවිද්දකු බුද්ධ-දෙශනයන්ට අගෞරව වන අන්දමින් කථා කරන සාමණේරයකු ලඟ තබා ගැනීම පචිත්තියකි. (70)

## viii. සහධම්මික වග්ග

120. යම් පැවිද්දකු භික්ෂූන් විසින් අනුශාසනා කරන ලද ශික්ෂා- පදවල නොපිහිටීම පචිත්තියකි. (71)

---

| | | | |
|---|---|---|---|
| 112. | විනය-සු.වි. | පාචිත්තිය | lxiii 1 |
| 113. | ,, සු.වි. | ,, | lxiv 1 |
| 114. | ,, සු.වි. | ,, | lxv 1 |
| 115. | ,, සු.වි. | ,, | lxvi 1 |
| 116. | ,, සු.වි. | ,, | lxvii 1 |
| 117. | ,, සු.වි. | ,, | lxviii 1 |
| 118. | ,, සු.වි. | ,, | lxix 1 |
| 119. | ,, සු.වි. | ,, | lxx 1 |
| 120. | ,, සු.වි. | ,, | lxxi 1 |

121. යම් පැවිද්දකු පාතිමොක්ඛය දෙසූ කළ ඊට දෙස් පැවරීම පචිතියකි. (72)

122. යම් පැවිද්දකු පාතිමොක්ඛය දෙශනා කළ එය නො පිළිගැනීම පචිතියකි. (73)

123. යම පැවිද්දකු තව පැවිද්දකුට පහර දීම පචිතියකි. (74)

124. යම් පැවිද්දකු තව පැවිද්දකුට පහර දීමට අත ඉස්සීම පචිතියකි. (75)

125. යම් පැවිද්දකු තව පැවිද්දකුට අහේතුක සඞ්ඝාදිසෙසාපත්තියකින් චෝදනා කිරීම පචිතියකි. (76)

126. යම් පැවිද්දකු දැනුවත්ව තව පැවිද්දකු තුළ කුකුස් ඉපදවීම පචිතියකි. (77)

127. යම් පැවිද්දකු භික්ෂූන්ගේ කථා සල්ලාපයන් රහසින් ඇසීම පචිතියකි. (78)

128. යම් පැවිද්දකු ධර්මානුකූලව එකඟත්වයකට පැමිණ පසුව ඊට දෙස් කීම පචිතියකි. (79)

129. යම් පැවිද්දකු සංඝයා යම්කිසි කරුණක් පිළිබඳව සාකච්ඡා කරන අවස්ථාවක සිය අනුමැතිය නොදී එයින් නික්ම යෑම පචිතියකි. (80)

130. යම් පැවිද්දකු සඟ සතු සිවුරක් දී පසුව ඒ පිළිබඳව දෙස් කීම පචිතියකි. (81)

---

| | | | | |
|---|---|---|---|---|
| 121. | විනය- | සු.වි. | පාචිත්තිය | lxxii 1 |
| 122. | ,, | සු.වි. | ,, | lxxiii 1 |
| 123. | ,, | සු.වි. | ,, | lxxiv 1 |
| 124. | ,, | සු.වි. | ,, | lxxv 1 |
| 125. | ,, | වි.සු. | ,, | lxxvi 1 |
| 126. | ,, | සු.වි. | ,, | lxxvii1 |
| 127. | ,, | සු.වි. | ,, | lxxviii 1 |
| 128. | ,, | සු.වි. | ,, | lxxix 1 |
| 129. | ,, | සු.වි. | ,, | lxxx 1 |
| 130. | ,, | සු.වි. | ,, | lxxxi 1 |

131. යම් පැවිද්දකු සහ සතු ද කෙනකුගේ පෞද්ගලික ප්‍රයෝජනය පිණිස වෙන් කිරීම පචිතියකි. (82)

## ix. රතන වග්ග

132. යම් පැවිද්දකු රජ සහ දේවිය ඇතුල් ගෙයි සිටියදී නොදන්වා එහි යෑම පචිතියකි. (83)

133. යම් පැවිද්දකු වනයෙහි හෝ නිවසෙහි හෝ හැර වෙන ස්ථානයක වූ රන්, රිදී, මුතු, මැණික් ඇහිදීම මෙන්ම ඇහිදවීමද පචිතියකි. (84)

134. යම් පැවිද්දකු තව පැවිද්දකුට නොකියා ගම් වැදීම පචිතියකි. (85)

135. යම් පැවිද්දකු ඉඳිකටු දැමීම පිණිස කටු, ඇත්දත්, අං ආදියෙන් උපකරණ සෑදවීම පචිතියකි. (86)

136. යම් පැවිද්දකු සුගත් වියතින් අට අඟලකට වඩා උස්වූ කකුල්-වලින් යුත් ඇඳ පුටු ආදිය කරවීම පචිතියකි. (87)

137. යම් පැවිද්දකු පුළුන් ඇතිරිල්ලකින් යුත් ඇඳ පුටු ආදිය කර-වීම පචිතියකි. (88)

138. යම් පැවිද්දකු දිගින් වියත් දෙකකට ද, පළලින් එකහමාරකට ද වැඩි ඇතිරිල්ලක් තබා ගැනීම පචිතියකි. (89)

139. යම් පැවිද්දකු දිගින් වියත් සතරකට ද, පළලින් වියත් දෙක-කට ද වැඩි කස්පිළියන ක් තබා ගැනීම පචිතියකි. (90)

---

| | | | |
|---|---|---|---|
| 131. | විනය-සු.වි. | පාචිත්තිය | lxxxii 1 |
| 132. | ,, සු.වි. | ,, | lxxxiii 1.3 |
| 133. | ,, සු.වි. | ,, | lxxxiv 3 |
| 134. | ,, සු වි. | ,, | lxxxv 4 |
| 135. | ,, සු.වි. | ,, | lxxxvi 1 |
| 136. | ,, සු.වි. | ,, | lxxxvii 1 |
| 137. | ,, සු.වි. | ,, | lxxxviii 1 |
| 138. | ,, සු.වි. | ,, | lxxxix 2 |
| 139. | ,, සු.වි. | ,, | xc i |

140. යම් පැවිද්දකු දිගින් වියත් හයකට ද, පළලින් වියත් දෙකහමාරකට ද වැඩි වැසි සිවුරක් තබා ගැනීම පචිතියකි. (91)
141. යම් පැවිද්දකු දිගින් වියත් නවයක්ද, පළලින් වියත් හයක් ද වූ සුගත් සිවුරේ ප්‍රමාණය ඉක්මවූ සිවුරක් තබා ගැනීම පචිතියකි. (92)

## 6. පාටිදෙසනිය සූත්‍ර සතර

142. යම් පැවිද්දකු ඇතුල්ගමට වැද ඥාති නොවූ භික්ෂුණියකගේ අතින් කෑයුතු දෙයක් සියතින් පිළිගෙන වැළඳීම පාටිදෙසනියකි. (1)
143. භික්ෂූන් වළඳමින් සිටින විට 'මෙහි බෙදව'යි විධානය කරමින් සිටින කිසියම් භික්ෂුණියක් වෙතොත් ඒ භික්ෂුණියට ඉවත යෑමට නොකියා වැළඳීම පාටිදෙසනියකි. (2)
144. යම් පැවිද්දකු සෙඛ සම්මත නිවසකට ආරාධනයක් නොමැතිව පැමිණ කෑයුතු දෙය සියතින් ගෙන අනුභව කිරීම පාටිදෙසනයකි. (3)
145. යම් පැවිද්දකු වනයෙහි නිවාසය කොට සිටින විට පෙර දැනුම් දීමක් නොමැතිව ගෙනෙන ලද කෑයුතු දෑය සිය නිවසෙහිදීම සියතින් පිළිගෙන වැළඳීම පාටිදෙසනියකි. (4)

## 7. සෙඛිය සූත්‍ර සැත්තෑ-පහ

### i. පරිමණ්ඩල වග්ග

146. යම් පැවිද්දකු හාත්පසින් වටකොට නො ඇඳීම දුෂ්කෘත ආපත්තියකි. (1)

---

| | | | | |
|---|---|---|---|---|
| 140. | විනය-සු.වි. | පාචිත්තිය | xci 1 |
| 141. | ,, සු.වි. | ,, | xcii 1 |
| 142. | ,, සු.වි. | පාටිදෙසනිය | i 1 |
| 143. | ,, සු.වි. | ,, | ii 1 |
| 144. | ,, සු.වි. | ,, | iii 3 |
| 145. | ,, සු.වි. | ,, | iv 2 |
| 146. | ,, සු.වි. | සෙඛිය | i |

147. යම් පැවිද්දකු හාත්පසින් වටකොට නො පෙරවීම දුෂ්කෘත ආපත්තියකි. (2)
148. යම් පැවිද්දකු මැනවින් ඇඳ පෙරවා නොමැතිව ගම් වැදීම දුෂ්කෘත ආපත්තියකි. (3)
149. යම් පැවිද්දකු මැනවින් ඇඳ පෙරවා නොමැතිව ගමෙහි අසුන් ගැනීම දුෂ්කෘත ආපත්තියකි. (4)
150. යම් පැවිද්දකු සුවිනිතභාවයෙන් තොරව ගම් වැදීම දුෂ්කෘත ආපත්තියකි. (5)
151. යම් පැවිද්දකු සුවිනිතභාවයෙන් තොරව ගමෙහි අසුන් ගැනීම දුෂ්කෘත ආපත්තියකි. (6)
152. යම් පැවිද්දකු යටහෙලන ඇස් ඇතිව ගම් වැදීම දුෂ්කෘත ආපත්තියකි. (7)
153. යම් පැවිද්දකු යටහෙලන ඇස් ඇතිව ගමෙහි අසුන් ගැනීම දුෂ්කෘත ආපත්තියකි. (8)
154. යම් පැවිද්දකු නගන ලද සිවුරු ඇතිව ගම් වැදීම දුෂ්කෘත ආපත්තියකි. (9)
155. යම් පැවිද්දකු නගන ලද සිවුරු ඇතිව ගමෙහි අසුන් ගැනීම දුෂ්කෘත ආපත්තියකි. (10)

## ii. උජ්ඣග්ගික වග්ග

156. යම් පැවිද්දකු මහා සිනා ඇතිව ගම් වැදීම දුෂ්කෘත ආපත්තියකි. (11)

---

| | | | | |
|---|---|---|---|---|
| 147. | විනය- | සු.වි. | සෙඛිය | 2 |
| 148. | ,, | සු.වි. | ,, | 3 |
| 149. | ,, | සු.වි. | ,, | 4 |
| 150. | ,, | සු.වි. | ,, | 5 |
| 151. | ,, | සු.වි. | ,, | 6 |
| 152. | ,, | සු.වි. | ,, | 7 |
| 153. | ,, | සු.වි. | ,, | 8 |
| 154. | ,, | සු වි. | ,, | 9 |
| 155. | ,, | සු.වි. | ,, | 10 |
| 156. | ,, | සු.වි. | ,, | 11 |

157. යම් පැවිද්දකු මහා සිනා ඇතිව ගමෙහි අසුන් ගැනීම දුෂ්කෘත ආපත්තියකි. (12)

158. යම් පැවිද්දකු මහත් ශබ්ද නඟමින් ගම් වැදීම දුෂ්කෘත ආපත්තියකි (13)

159. යම් පැවිද්දකු මහත් ශබ්ද නඟමින් ගමෙහි අසුන් ගැනීම දුෂ්කෘත ආපත්තියකි. (14)

160. යම් පැවිද්දකු කය සලසලා ගම් වැදීම දුෂ්කෘත ආපත්තියකි. (15)

161. යම් පැවිද්දකු කය සලසලා ගමෙහි අසුන් ගැනීම දුෂ්කෘත ආපත්තියකි. (16)

162. යම් පැවිද්දකු අත සලසලා ගම් වැදීම දුෂ්කෘත ආපත්තියකි. (17)

163. යම් පැවිද්දකු අත සලසලා ගමෙහි අසුන් ගැනීම දුෂ්කෘත ආපත්තියකි. (18)

164. යම් පැවිද්දකු හිස සලසලා ගම් වැදීම දුෂ්කෘත ආපත්තියකි. (19)

165. යම් පැවිද්දකු හිස සලසලා ගමෙහි අසුන් ගැනීම දුෂ්කෘත ආපත්තියකි. (20)

### iii. ඛම්භකත වග්ග

166. යම් පැවිද්දකු උකුලෙහි තබන ලද අත් ඇතිව ගම් වැදීම දුෂ්කෘත ආපත්තියකි. (21)

---

| | | | |
|---|---|---|---|
| 157. | විනය- | සු.වි. සෙඛිය | 12 |
| 158. | ,, | සු.වි. ,, | 13 |
| 159. | ,, | සු.වි. ,, | 14 |
| 160. | ,, | සු.වි. ,, | 15 |
| 161. | ,, | සු.වි. ,, | 16 |
| 162. | ,, | සු.වි. ,, | 17 |
| 163. | ,, | සු.වි. ,, | 18 |
| 164. | ,, | සු.වි. ,, | 19 |
| 165. | ,, | සු.වි. ,, | 20 |
| 166. | ,, | සු.වි. ,, | 21 |

167. යම් පැවිද්දකු උකුලෙහි තබන ලද අත් ඇතිව ගමෙහි අසුන් ගැනීම දුෂ්කෘත ආපත්තියකි. (22)
168. යම් පැවිද්දකු හිස වසා පොරවා ගෙන ගම් වැදීම දුෂ්කෘත ආපත්තියකි. (23)
169. යම් පැවිද්දකු හිස වසා පොරවා ගෙන ගමෙහි අසුන් ගැනීම දුෂ්කෘත ආපත්තියකි. (24)
170. යම් පැවිද්දකු විළුඹෙන් හෝ පා ඇඟිලිවලින් හෝ ගමන් කිරීම දුෂ්කෘත ආපත්තියකි. (25)
171. යම් පැවිද්දකු අකවටුව හෝ ඇවිළීම්ව හෝ ගමෙහි අසුන් ගැනීම දුෂ්කෘත ආපත්තියකි. (26)
172. යම් පැවිද්දකු සිහි එලවා අහර නොපිළිගැනීම දුෂ්කෘත ආපත්තියකි. (27)
173. යම් පැවිද්දකු තම පාත්‍රය පිළිබඳව සංඥා නොමැතිව අහර පිළිගැනීම දුෂ්කෘත ආපත්තියකි. (28)
174. යම් පැවිද්දකු බත් කොටසින් සතරෙන් පංගුවක් පමණ වූ සූපාදිය නොපිළිගැනීම දුෂ්කෘත ආපත්තියකි. (29)
175. යම් පැවිද්දකු පා මුවවිට යට රේඛාව හා සමව නො පිළිගැනීම දුෂ්කෘත ආපත්තියකි. (30)

## iv. සක්කච්ච වග්ග

176. යම් පැවිද්දකු සිහි එලවා අහර නොවැළඳිම දුෂ්කෘත ආපත්තියකි. (31)

---

| | | | | |
|---|---|---|---|---|
| 167. | විනය | සු.වි. | සෙඛිය | 22 |
| 168. | ,, | සු.වි. | ,, | 23 |
| 169. | ,, | සු.වි. | ,, | 24 |
| 170. | ,, | සු.වි. | ,, | 25 |
| 171. | ,, | සු.වි. | ,, | 26 |
| 172. | ,, | සු.වි. | ,, | 27 |
| 173. | ,, | සු.වි. | ,, | 28 |
| 174. | ,, | සු.වි. | ,, | 29 |
| 175. | ,, | සු.වි. | ,, | 30 |
| 176. | ,, | සු.වි. | ,, | 31 |

177. යම් පැවිද්දකු තම පාත්‍රය පිළිබඳව සංඥ නොමැතිව අහර වැළඳීම දුෂ්කෘත ආපත්තියකි. (32)
178. යම් පැවිද්දකු පිළිවෙලින් නොවැළඳීම දුෂ්කෘත ආපත්තියකි. (33)
179. යම් පැවිද්දකු සූප සමව ගෙන නොවැළඳීම දුෂ්කෘත ආපත්තියකි. (34)
180. යම් පැවිද්දකු බත මුදුනින් අනා වැළඳීම දුෂ්කෘත ආපත්තියකි. (35)
181. යම් පැවිද්දකු බතින් සූපාදිය වැසීම දුෂ්කෘත ආපත්තියකි.(36)
182. යම් පැවිද්දකු නොගිලන්ව සිටියදී තමාගේ ප්‍රයෝජනය පිණිස බත් හෝ සූපාදිය හෝ ඉල්ලීම දුෂ්කෘත ආපත්තියකි. (37)
183. යම් පැවිද්දකු වෙඝ සිතින් අනුන් වළඳන පාත්‍රය දෙස බැලීම දුෂ්කෘත ආපත්තියකි. (38)
184. යම් පැවිද්දකු මහත් පිඩුකොට වැළඳීම දුෂ්කෘත ආපත්තියකි. (39)
185. යම් පැවිද්දකු පිඩු නොකොට වැළඳීම දුෂ්කෘත ආපත්තියකි. (40)

**v. කබළ වග්ග**

186. යම් පැවිද්දකු අහර පිඩු මුව ළඟට නො පමුණුවා මුව විවෘත කිරීම දුෂ්කෘත ආපත්තියකි. (41)

---

| | | | | |
|---|---|---|---|---|
| 177. | විනය- | සු.වි. | සෙඛිය | 32 |
| 178. | ,, | සු.වි. | ,, | 33 |
| 179. | ,, | සු.වි. | ,, | 34 |
| 180. | ,, | සු.වි. | ,, | 35 |
| 181. | ,, | සු.වි. | ,, | 36 |
| 182. | ,, | සු.වි. | ,, | 37.2 |
| 183. | ,, | සු.වි. | ,, | 38 |
| 184. | ,, | සු.වි. | ,, | 39 |
| 185. | ,, | සු.වි. | ,, | 40 |
| 186. | ,, | සු.වි. | ,, | 41 |

187. යම් පැවිද්දකු වළඳන විට ඇඟිලි සියල්ලම මුව තුළට දැමීම දුෂ්කෘත ආපත්තියකි. (42)
188. යම් පැවිද්දකු අහර සහිත මුවින් කථාකිරීම දුෂ්කෘත ආපත්ති-යකි. (43)
189. යම් පැවිද්දකු අහර පිඩු මුඛයට දම දමා වැළඳීම දුෂ්කෘත ආපත්තියකි. (44)
190. යම් පැවිද්දකු අහර පිඩු කඩ කඩා වැළඳීම දුෂ්කෘත ආපත්-තියකි. (45)
191. යම් පැවිද්දකු හකු පුරව පුරවා වැළඳීම දුෂ්කෘත ආපත්තියකි. (46)
192. යම් පැවිද්දකු අත ගස ගසා වැළඳීම දුෂ්කෘත ආපත්තියකි.(47)
193. යම් පැවිද්දකු බත් උළු ඉසිර ඉසිරා වැළඳීම දුෂ්කෘත ආපත්-තියකි. (48)
194. යම් පැවිද්දකු දිව නෙරව නෙරවා වැළඳීම දුෂ්කෘත ආපත්-තියකි. (49)
195. යම් පැවිද්දකු 'චපු, චපු' යන හඬ නඟ නඟා වැළඳීම දුෂ්කෘත ආපත්තියකි. (50)

## vi. සුරුසුරු වග්ග

196. යම් පැවිද්දකු 'සුරුසුරු' යන හඬ නඟ නඟා වැළඳීම දුෂ්කෘත ආපත්තියකි. (51)

---

| | | | | |
|---|---|---|---|---|
| 187. | විනය- | සු.වි. | සෙඛිය | 42 |
| 188. | ,, | සු.වි. | ,, | 43 |
| 189. | ,, | සු.වි. | ,, | 44 |
| 190. | ,, | සු.වි. | ,. | 45 |
| 191. | ,, | සු.වි. | ,, | 46 |
| 192. | ,, | සු.වි. | ,, | 47 |
| 193. | ,, | සු.වි. | ,, | 48 |
| 194. | ,, | සු.වි. | ,, | 49 |
| 195. | ,, | සු.වි. | ,, | 50 |
| 196. | ,, | සු.වි. | ,, | 51 |

197. යම් පැවිද්දකු අත ලෙව ලෙවා වැළඳීම දුෂ්කෘත ආපත්තියකි. (52)

198. යම් පැවිද්දකු පාත්‍රය සූර සූරා වැළඳීම දුෂ්කෘත ආපත්තියකි. (53)

199. යම් පැවිද්දකු දිවෙන් තොල් ලෙව ලෙවා වැළඳීම දුෂ්කෘත ආපත්තියකි. (54)

200. යම් පැවිද්දකු වළඳන අතින් පැන් භාජනය ඇල්ලීම දුෂ්කෘත ආපත්තියකි. (55)

201. යම් පැවිද්දකු පාත්‍රය සේදූ දිය ඇතුල් ගෙයි දැමීම දුෂ්කෘත ආපත්තියකි. (56)

202. යම් පැවිද්දකු කුඩ ඉසලාගත් අයකුට ධර්මය දෙසීම දුෂ්කෘත ආපත්තියකි. (57)

203. යම් පැවිද්දකු යෂ්ටියක් අතින් ගත් අයකුට ධර්මය දෙසීම දුෂ්කෘත ආපත්තියකි. (58)

204. යම් පැවිද්දකු කඩුවක් අතින් ගත් අයකුට ධර්මය දෙසීම දුෂ්කෘත ආපත්තියකි. (59)

205. යම් පැවිද්දකු අවියක් ගත් අයකුට ධර්මය දෙසීම දුෂ්කෘත ආපත්තියකි. (60)

### vii. පාදුක වග්ග

206. යම් පැවිද්දකු මිරිවැඩි පය ලා සිටි අයකුට ධර්මය දෙසීම දුෂ්කෘත ආපත්තියකි. (61)

---

| | | | |
|---|---|---|---|
| 197. | විනය–සු.වි. | සෙඛිය | 52 |
| 198. | ,, සු.වි. | ,, | 53 |
| 199. | ,, සු.වි. | ,, | 54 |
| 200. | ,, සු.වි. | ,, | 55 |
| 201. | ,, සු.වි. | ,, | 56 |
| 202. | ,, සු.වි. | ,, | 57.2 |
| 203. | ,, සු.වි. | ,, | 58 |
| 204. | ,, සු.වි. | ,, | 59 |
| 205. | ,, සු.වි. | ,, | ꜰ0 |
| 206. | ,, සු.වි. | ,, | 61 |

207. යම් පැවිද්දකු පාවහන් පය ලා සිටි අයකුට ධර්මය දෙසීම දුෂ්කෘත ආපත්තියකි. (62)

208. යම් පැවිද්දකු යානාවක සිටින අයකුට ධර්මය දෙසීම දුෂ්කෘත ආපත්තියකි. (63)

209. යම් පැවිද්දකු සයනයක සිටින අයකුට ධර්මය දෙසීම දුෂ්කෘත ආපත්තියකි. (64)

210. යම් පැවිද්දකු අකවටුව සිටින අයකුට ධර්මය දෙසීම දුෂ්කෘත ආපත්තියකි. (65)

211. යම් පැවිද්දකු හිස් වෙළුමක් ඇතිව සිටින අයකුට ධර්මය දෙසීම දුෂ්කෘත ආපත්තියකි. (66)

212. යම් පැවිද්දකු හිස් වැසුමකින් යුත් අයකුට ධර්මය දෙසීම දුෂ්කෘත ආපත්තියකි. (67)

213. යම් පැවිද්දකු ආසනයක සිටින අයකුට ධර්මය දෙසීම දුෂ්කෘත ආපත්තියකි. (68)

214. යම් පැවිද්දකු මිටි ආසනයක සිට උස් ආසනයක සිටින අයකුට ධර්මය දෙසීම දුෂ්කෘත ආපත්තියකි. (69)

215. යම් පැවිද්දකු සිට ගෙන, ඉඳ සිටි අයකුට ධර්මය දෙසීම දුෂ්කෘත ආපත්තියකි. (70)

216. යම් පැවිද්දකු පෙරටුව යන අයකුට පස්සෙන් යමින් ධර්මය දෙසීම දුෂ්කෘත ආපත්තියකි. (71)

217. යම් පැවිද්දකු පටු මග යන අයකුට එමහ පැත්තකින් යමින් ධර්මය දෙසීම දුෂ්කෘත ආපත්තියකි. (72)

---

| | | | | |
|---|---|---|---|---|
| 207. | විනය- | සු.වි. | සෙඛිය | 62 |
| 208. | ,, | සු.වි. | ,, | 63 |
| 209. | ,, | සු.වි. | ,, | 64 |
| 210. | ,, | සු වි. | ,, | 65 |
| 211. | ,, | සු.වි. | ,, | 66 |
| 212. | ,, | සු.වි. | ,, | 67 |
| 213. | ,, | සු.වි. | ,, | 68 |
| 214. | ,, | සු.වි. | ,, | 69 |
| 215. | ,, | සු.වි. | ,, | 70 |
| 216. | ,, | සු.වි. | ,, | 71 |
| 217. | ,, | සු.වි. | ,, | 72 |

218. යම් පැවිද්දකු සිට ගෙන මල මූත්‍ර කිරීම දුෂ්කෘත ආපත්තියකි. (73)

219. යම් පැවිද්දකු තණ ඇති තැනෙහි මලමූත්‍ර කිරීම දුෂ්කෘත ආපත්තියකි. (74)

220. යම් පැවිද්දකු ජලයෙහි මල මූත්‍ර කිරීම දුෂ්කෘත ආපත්තියකි. (75)

## 8. අධිකරණ-සමථ සූත්‍ර සත

221. සම්මුඛා විනය (1)
222. සති විනය (2)
223. අමූළ්හ විනය (3)
224. පටිඤ්ඤාය විනය (4)
225. යෙභුය්‍යසිකා (5)
226. තස්සපාපිය්‍යසිකා (6)
227. තිණවත්ථාරක (7)

## II. භික්ඛුණීවිභඞ්ග

**භික්ෂුණීයන්ගේ ශීලය පිළිබඳ සූත්‍ර (ශික්ෂාපද -ව්‍යවස්ථා) දක්වන ග්‍රන්ථය 'භික්ඛුණීවිභඞ්ග' නම්. මෙය භික්ඛුවිභඞ්ගයට කළ කෙටි අටුවාවක් වැන්න. මෙහි සූත්‍ර භික්ඛුවිභඞ්ගයෙහි සූත්‍රවලට උපමිතිව සකස් කොට ඇත. එහෙත් මෙහි භික්ඛුවිභඞ්ගයෙහි සඳහන් කාණ්ඩ අටෙන් 'අනියත' කාණ්ඩය දක්නට නොලැබේ. මෙහි සඳහන් වනුයේ පාරාජිකා, සඞ්ඝාදිසෙස,**

---

218. විනය-සු.වි. සෙඛිය 73
219. ,, සු.වි. ,, 74
220. ,, සු.වි. ,, 75
221-227. විනය-සු.වි. අධිකරණ-සමථ මෙහි මතු විස්තර වේ.

නිස්සග්ගිය පාචිත්තිය, පාචිත්තිය, පාටිදෙසනිය, සෙඛිය සහ අධිකරණ-සමථ යන කාණ්ඩ හත පමණ ය.

## 2. ඛන්ධක

සැදැහැයෙන් සසුන් වන් භික්ෂු භික්ෂුණියන් සංවරයෙහි පිහිටුවන, ඛන්ධක වශයෙන් විනය පිටකයෙහි දැක්වෙන පරිච්ඡේදයන් සුත්තවිභඩ්ගයට කළ පරිශිෂ්ටයක් වැන්න. පාතිමොක්ඛ ශික්ෂාපද සුත්තවිභඩ්ගයෙහි පසුබිම වූවාක් මෙන් මෙහි පසුබිම වී ඇත්තේ කම්මවාචා ශික්ෂාපද ය. සුත්තවිභඩ්ගයෙහි මෙන් මෙහිද ශික්ෂාපද දක්වනුයේ එම ශික්ෂාපද ඇති වූ පිළිවෙලත්, ඇතිවීමට හේතුවූ දැත් ප්‍රථමයෙන්ම විස්තර කෙරෙමිනි. ඛන්ධකවල එන කථා වස්තු ගොඩ නඟා තිබෙන රීතිය සුත්තවිභඩ්ගයෙහි කථා වස්තු සකස්කර තිබෙන රීතියට ඉතාමත් සමාන ය.

විනය පිටකයෙහි දක්වෙන ඛන්ධක විසිදෙක කොටස් දෙකකට බෙදු ඇත. එනම්, 'මහාවග්ග' සහ 'චුල්ලවග්ග' යනුවෙනි. මහාවග්ගයට ඛන්ධක දහයක් ද, චුල්ලවග්ගයට ඛන්ධක දොළහක් ද අයත් වේ.

### I. මහාවග්ග

මහාවග්ගයෙහි සඳහන් ඛන්ධක දහය මහාඛන්ධක, උපොසථක්ඛන්ධක, වස්සූපනායිකක්ඛන්ධක, පවාරණක්ඛන්ධක, චම්මක්ඛන්ධක, භෙසජ්ජක්ඛන්ධක,

කඨිනක්ඛන්ධක, චීවරක්ඛන්ධක, චම්පෙය්‍යක්ඛන්ධක, සහ කොසම්බක්ඛන්ධක යනුවෙන් හැඳින් වේ. භික්ෂූන් සංවරයෙහි පිහිටුවීම පරමාර්ථ කොට, බුද්ධශාසනය පිළිබඳ කරුණු දක්වෙන මේ ඛන්ධකවල බුද්ධචරිතය දක්වනුයේ ඉතාමත් ලුහුඬිනි.

මහාඛන්ධකයෙහි සිදුහත් කුමරු බුදුබව ලැබීමෙන් පසු එතුමාගේ චරිතයෙහි වූ ප්‍රථම වැදගත් සිදුවීම් පැරණි මටසිළුටු බසකින් විස්තර වේ. බුදුබව ලැබීමෙන් පසු බුදුහු උරුවෙල් දනව්වෙහි නෙරඤ්ජරා නම් ගංතෙරෙහි වැඩ විසූහ. එහි බෝධිවෘක්ෂ මූලයෙහි, අජපාල වෘක්ෂ මූලයෙහි, මුචලින්ද වෘක්ෂ මූලයෙහි සහ රාජායතන වෘක්ෂ මූලයෙහි වූ සිදුවීම් මේ ඛන්ධකයෙහි විස්තර වේ. මේ ලොවෙහි 'බුදුන්, දහම්' යන රත්නද්වයෙහි පළමු කොට සරණ ගොස් උපාසක වූ තපුස්ස සහ භල්ලුක නම් දෙ බෑ වෙළඳුන් ගැනද, බරණැස ඉසිපතනයට වඩිනා බුදුන්ට අතර මඟදී සමුවූ උපක නම් ආජීවකයා ගැනද, බරණැස මෘගදායෙහි ප්‍රථම දම්සක් පැවැත්වීමද, අඤ්ඤාකොණ්ඩඤ්ඤ, භද්දිය, වප්ප, මහානාම සහ අස්සජි නම් පස්වග මහණුන් පිළිබඳ ද, පළමු කොට සරණ ගොස් උපාසක වූ යස තෙරුන් සහ එතුමාගේ ඥතිමිත්‍රාදීන් පිළිබඳ ද මේ ඛන්ධකයෙහි සඳහන් වේ. මාරයා බුදුන් කරා එළඹ පසුව පලායෑම ද මෙහි විස්තර වේ. භද්දවග්ගිය කථා පුවත මෙන්ම තාපසයන් විසින් පිරිවරණ ලද උරුවෙල කාශ්‍යප, නදී කාශ්‍යප සහ ගයා කාශ්‍යප යන තුන්මහතවුසන් ඒහි භික්ඛුභාවයෙන් පැවිදි කරවීම ද, බුදුන් බිම්සර රජුන් ප්‍රථම වරට සමුවීම ද, සැරියුත් මුගලන් අගසව් තනතුරෙහි තබා පැවිදිකරවීම ද මෙහි විස්තර වේ.

මහාඛන්ධකයෙහි, උපාධ්‍යායයින් සමග වසන්න-

වුන් වූ සද්ධිවිහාරිකයින්ගේ ද, සද්ධිවිහාරිකයින්ගේ දෝෂ විමසා සුදුසු ලෙස අවවාද අනුශාසනයන් කරන ගුරුවරුන් වූ උපාධ්‍යායයින්ගේ ද, ආචාර්යයින් සමග වසන්නවුන් වූ අන්තේවාසිකයින්ගේ ද, අන්තේවාසික-යින්ගේ ගුරුවරුන් වූ ආචාර්යයින්ගේ ද වත් පිළිවෙත් ආදිය දක්වේ. භික්ෂූන් පැවිදිකිරීමේ සහ උපසම්පදා-කිරීමේ පිළිවෙළද මෙහි දක්වේ.

උපොසථක්ඛන්ධයෙහි උපොසථ උත්සවය සහ පාතිමොක්ඛය පිළිබඳ විස්තර වේ. පාතිමොක්ඛයෙහි නිදාන කථා වස්තුව සඳහන් වනුයේ මෙහි ය:

"ස්වාමීනි, සඞ්ඝයා මා ශ්‍රවණය කෙරේවා!

"අද පුණුරුස් පොහෝ දවස ය. ඉදින් සඞ්ඝයාට සුදුසු කාලය වී නම්, සඞ්ඝයා පොහෝ කෙරේවා, පාමොක් උදෙස්වා. සඞ්ඝයාගේ මූලික කටයුතු කරන ලද ද? ආයුෂ්මතුනි, (තම) පිරිසිදු බව කියව්. (මම) පාමොක් උදෙසන්නෙමි.

"එය අපි සැමදෙනම යහපත් ලෙස අසමු; ධාරණය කර ගනිමු..

"යමෙකුට ඇවතක් වී ඇත් නම්, ඔහු (එය) ප්‍රකාශ කෙරේවා. ඇවතක් වී නැත් නම්, තුෂ්ණිම්භූත විය යුතුයි.

"ආයුෂ්මතුනි, තුෂ්ණිම්භූතවීමෙන් පිරිසිදු ය යි පිළි-ගනිමි. යම් සේ වෙන් වෙන් වශයෙන් විචාරණ ලද්ද-කුගේ ප්‍රකාශකිරීම වේද, එසේම මේ වූ පිරිසෙහි තුන් යලක් අනුසාවනය වේ. යම් භික්ෂුවක් තුන් යලක් අනුසාවනයෙන් සිහි කළ තම ඇවත ප්‍රකාශ නොකෙරේ නම්, ඔහුට සම්පජාන මුසාවාදය වේ. ආයුෂ්මතුනි, සම්පජාන මුසාවාදය (ධ්‍යානාදීන්ගේ ප්‍රතිලාභයට) අන්තරායකර ධර්මයකැයි භාග්‍යවතුන් වහන්සේ විසින්

චෝදනා ලද්දකි. එහෙයින් ඇවතට පැමිණ, (එය) සිහි කොට, (එයින් මිදී) විශුද්ධිය අපේක්ෂාකරන භික්ෂුව විසින් තම ඇවත ප්‍රකාශ කළ යුතුයි. ඇවත ප්‍රකාශ කරන්නාට (ධ්‍යානාදීන්ගේ ප්‍රතිලාභයට) පහසුවක් වේ.[1]

වස්සූපනායිකක්ඛන්ධකයෙහි භික්ෂූන්ගේ වැසි කල වාසය පිළිබඳ කරුණු දැක්වේ. වැසි කල අවසාන-යෙහි පවත්වන 'පවාරණය' පිළිබඳ පවාරණක්-ඛන්ධයෙහි සඳහන් වේ.

චම්මක්ඛන්ධකයෙහි හම්වලින් කරන ලද භාණ්ඩ පාවිච්චි කිරීම පිළිබඳව න්‍යායන් දැක්වේ. නිල්, කහ, රතු, දුඹුරු, කළු සහ රතු මිශ්‍ර හෝ කහ මිශ්‍ර හෝ යම් වර්ණයකින් යුත් දර ඇති පාවහන් භික්ෂූන්ගේ පාවිච්-චියට නුසුදුසු ය. විළුඹ වැසෙන පරිදි සකස්ව ඇති පාවහන් භික්ෂූන්ගේ පාවිච්චියට සුදුසු නැත. ආරාමය තුළ පාවහන් පාවිච්චිය ද සුදුසු නැත. ලී වලින්ද, තාලිපත් වලින්ද, තින මුඤ්ජ ආදී තෘණවලින්ද සැදුම් ලත් පාවහන් භික්ෂූන්ට සුදුසු නොවේ. සිංහ, කොටි ආදී සතුන්ගේ සම්වලින් කරන ලද කිසියම් භාණ්ඩයක් භික්ෂූන් විසින් පාවිච්චි නො කළ යුතුය. භික්ෂූන්ට පල්ලැක්කියකින් යුත් ආසන පාවිච්චි කළ හැකිය. එහෙත් හාන්සිවීම පිණිස සැප පහසු විශාල ආසන පාවිච්චි කිරීම නුසුදුසු ය. එසේම ගිහියන් විසින් පිළි-යෙල කරන ලද ආසනවල වාඩිවීමට භික්ෂූන්ට අවසර ඇතත් එම ආසනවල සැතපීමට අවසර නැත.

භෙසජ්ජක්ඛන්ධකයෙහි භික්ෂූන්ගේ පාවිච්චියට සුදුසු බෙහෙත් ආදිය පිළිබඳව විස්තර දැක්වේ. ගිතෙල්, වෙඬරු, තෙල්, මධු සහ උක් භික්ෂූන්ගේ පරිභොගයට

---

[1] විනය-ම.ව. II 3.3

කැප කොට ඇත. බෙහෙත් වශයෙන්, නිසි අවස්ථාවෙහි ලැබ, නිසි අවස්ථාවෙහි පිස, නිසි අවස්ථාවෙහි මිශ්‍ර කරන ලද වලස්, මාළු, කිඹුල්, ඌරු, කොටළු ආදී සතුන්ගේ මාංශසාරය තෙල් සමග වැළඳීම භික්ෂූන්ට කැප ය. එහෙත් මිනිසුන්ගේ ද, අශ්වයින්ගේ ද, බල්ලන්ගේ ද, සර්පයින්ගේ ද, සිංහයින්ගේ ද, කළුහිස් වලසුන්ගේ ද මස් භික්ෂූන්ගේ අනුභවයට සුදුසු නැත. ඖෂධ වශයෙන් අමු මස් සහ ලේ භික්ෂූන්ට පරිභොග කළ හැකිය. ඖෂධ වශයෙන් භික්ෂූන්ගේ පාවිච්චියට සුදුසු බොහෝ මුල්, කොළ, ගෙඩි වර්ගද, කහට, ලාකඩ සහ ලුණු වර්ගද දක්වා ඇත. මුල් වශයෙන් කහ (හලිද්ද), ඉඟුරු (සිඞගිවෙර), වච, වචත්ථ, මහෞෂධ (අතිවිස), කටුකරොහිනි, උසිර සහ භද්දමුත්තක ආදියද, කොළ වශයෙන් කොසඹ (නිම්බ), කෙළින්ද (කුටජ), පතෝලා (පටොල), සුලසි සහ කපු (කප්පාසික) ආදියද, ගෙඩි වශයෙන් විලඞග, තිප්පිලි (පිප්පල), ගම්මිරිස් (මරිච), අරළු (හරීතක), බුළු (විභීතක), නෙල්ලි (ආමලක) සහ ගොඨඵල ආදියද, කහට වශයෙන් කොසඹ (නිම්බ), කෙළින්ද (කුටජ), පක්කව සහ කරඳ (නත්තමාල) ආදියද, ලාකඩ වශයෙන් පෙරුම්කායම් (හිඞගු) සහ තක ආදියද, ලුණු වශයෙන් මුහුදුලුණු (සාමුද්ද), කළුලුණු (කාළලොණ), සවිඳලුණු (සින්ධව), දියලුණු (උබ්භිද) සහ බිල ආදියද භික්ෂූන්ට සුදුසු ය. භික්ෂූන්ට ඇසට මෙන් හිසට ද බෙහෙත් තෙල් දැමිය හැකිය. නස්නකිරීමද භික්ෂූන්ට අවිනය නොවේ. එහෙත් හාත්පසින් අඟල් දෙකක් පමණ වූ ශල්‍යකර්මයක් ගුදය අසල කරවීමට භික්ෂූන්ට අවකාශ නැත. එසේම වස්තිකරවීමද නුසුදුසු ය.

භෙසජ්ජක්ඛන්ධකයෙහි භික්ෂූන්ගේ පරිභොගයට

සුදුසු ආහාර ආදියද, ආහාර පිළියෙල කරගතයුතු පිළිවෙත් ආදියද දැක්වේ. තවද බුදුන්ගේ පාටලීපුත්‍ර ගමනත්, කෝටිගාම ගමනත්, බුදුන් අම්බපාලි සහ ලිච්ඡවීන් සමුවීමත් මෙහි සඳහන් වේ. සීහ, මෙණ්ඩක, කෙනිය සහ රෝජ කථාවස්තූන්ද මෙහි විස්තර වේ.

කඨිනක්ඛන්ධයෙහි කඨින පුණ්‍යෝත්සවය පිළිබඳ විස්තරයක් වේ. චීවරක්ඛන්ධකයෙහි භික්ෂූන්ගේ වස්ත්‍රා පිළිබඳ සඳහන් වේ. එහි ජීවක සහ විසාඛාවගේ චරිතද දැක්වේ. චම්පෙය්‍යක්ඛන්ධකයෙහි සඞ්ඝයාගේ අනුමති විනයානුගතද යන වග නිශ්චය කිරීමට ඉවහල් වෙන කරුණු දැක්වේ. සඞ්ඝභෙද පිළිබඳ කරුණු කොසම්බක්ඛන්ධකයෙහි දැක්වේ. එහි දීඝාවුගේ කථාවස්තුවද විස්තර වේ.

## II. චුල්ලවග්ග

චුල්ලවග්ගයෙහි සඳහන් ඛන්ධක දෙළස. කම්මක්ඛන්ධක, පාරිවාසිකක්ඛන්ධක, සමුච්චයකක්ඛන්ධක, සමථක්ඛන්ධක, ඛුද්දකවත්ථුක්ඛන්ධක, සෙනාසනක්ඛන්ධක, සංඝභෙදක්ඛන්ධක, පාටිමොක්ඛඨපනක්ඛන්ධක, භික්ඛුනික්ඛන්ධක, පඤ්චසතිකක්ඛන්ධක සහ සත්තසතිකක්ඛන්ධක යනුවෙන් හැඳින් වේ. බුද්ධචරිතය සහ බුද්ධශාසනය පිළිබඳ කරුණු දැක්වෙන මේ ඛන්ධක දෙළසින් ප්‍රථම ඛන්ධක නවය ශාසනාවචර භික්ෂූන් සංවරයෙහි පිහිටුවීමට ඉවහල් වන කරුණු දක්වයි. දසවැනි ඛන්ධකය සසුන් වත් මෙහෙණින් උදෙසා කැපවී ඇත. එකොළොස් වැනි ඛන්ධකයෙහි රජගහ නුවරෙහි වූ ප්‍රථම ධර්මසඞ්ගායනාව පිළිබඳ විස්තරයක් දැක්වේ. විශාලා

මහනුවරෙහි වූ දෙවැනි ධර්මසඞ්ගායනාව පිළිබඳ විස්තරයක් මෙහි දෙළොස් වැනි ඛන්ධකයෙහි දැක්වේ. එකොළොස් වැනි සහ දෙළොස් වැනි ඛන්ධක චුල්ලවග්ගයට පසුව එකතු වූවක් ලෙස සලකත්.

කම්මක්ඛන්ධකයෙහි නොදැහැමි කම් දෙළසක් සහ දැහැමි කම් දෙළසක් වශයෙන් ගෙන තජ්ජනීය කර්මය, නිස්සය කර්මය, පබ්බාජනීය කර්මය, පටිසාරණීය කර්මය සහ උක්ඛෙපනීය කර්මය විස්තර වේ. උක්ඛෙපනීය කර්මය ඇවත නොදැනීමෙහි උක්ඛෙපනීය කර්මය, ඇවතට පිළියම් නොකිරීමෙහි උක්ඛෙපනීය කර්මය සහ ලාමක දෘෂ්ටි අත් නොහැරීමෙහි උක්ඛෙපනීය කර්මය යනුවෙන් ත්‍රිවිධාකාර වේ.

තජ්ජනීය කර්මය වනාහි සංඝයා විසින් යම් භික්ෂුවකට කරන ලබන තර්ජනයකි. මෙය ප්‍රධාන වශයෙන් කෝලාහල කරන භික්ෂූන්ට කරනු ලැබේ. එහෙත් තජ්ජනිය කර්මයට භාජනවීමට ඉවහල් වන හේතු හයක් ඇත. ඉන් කවර හේතුවකින් නමුත් වරදට පැමිණි භික්ෂුවට තජ්ජනිය කර්මය කිරීමට සඞ්ඝයාට බලය ඇත. මේ කර්මය කරනු ලැබූ භික්ෂුව විසින් පිළිපැදිය යුතු වත් දහඅටකි. එනම්, ඒ භික්ෂුව විසින් "උපසම්පද නො කළ යුතුය, නිස නො දිය යුතුය, හෙරණකු (ලවා තමන්ට) උපස්ථාන නො කරවිය යුතුය, මෙහෙණියන්ට අවවාද කිරීම පිණිස වූ සම්මුතිය නො ඉවසිය යුතුය, සම්මුතියෙන් හෝ මෙහෙණියන්ට අවවාද නො කළ යුතුය, යම් ඇවතක් කරණ කොට ගෙන සඞ්ඝයා විසින් තජ්ජනිය කර්මය කරනු ලැබේ ද, ඒ ඇවතට හෝ එබඳු අනෙක් ඇවතකට හෝ එයට වඩා පාපිෂ්ඨතර ඇවතකට හෝ නො පැමිණිය යුතුය, කර්මයට ගර්හා නො කළ යුතුය, කර්මය කළවුන්ට ගර්හා නො කළ යුතුය,

ප්‍රකෘති ස්වභාවය ඇති භික්ෂුවකගේ පොහොය නො තැබිය යුතුය, පවාරණය නො තැබිය යුතුය, ඇසිය යුත්තකු නො කළ යුතුය, දෝෂාරෝපනය නො පිහිටුවිය යුතුය, අවසර ගැන්ම නො කරවිය යුතුය, චෝදනා නො කළ යුතුය, (ඇවත්) සිහි නො කරවිය යුතුය, භික්ෂූන් සමග (නඩුහබ වල) නො යෙදිය යුතුය.''[1] මේ වත් සම්පූර්ණ කළ භික්ෂුවගේ තජ්ජනිය කර්මය සඞඝයා විසින් නවත්වනු ලැබේ.

නිස්සය කර්මය ලැබූ භික්ෂුව ව්‍යක්ත වූ අන් භික්ෂුවක් ආශ්‍රය කොට විසිය යුතුය. එබැවින්ම මෙයට 'නිස්සය කර්මය'යි නම් වේ. මෙය ප්‍රධාන වශයෙන් ඇවත් බහුල භික්ෂූන්ට කරනු ලැබේ. එහෙත් මේ කර්මයට භාජනවීමට ඉවහල් වන හේතු හයකි. එසේම මේ කර්මයෙන් මිදීමටද වත් දහඅටකි. මේ වත් දහඅට තජ්ජනීය කර්මය කරනු ලැබූ භික්ෂුව විසින් පිළිපැදිය යුතු වත් දහඅටට සමාන ය.

පබ්බාජනීය කර්මය ලැබූ භික්ෂුව සිටි ආරාමයෙන් අන් ආරාමයකට පිටත් කොට යැවිය යුතුය. එබැවින් මෙයට 'පබ්බාජනිය කර්මය'යි කියනු ලැබේ. මෙය ප්‍රධාන වශයෙන් කුල දූෂණය කරන සහ අනාචාරයෙහි හැසිරෙන භික්ෂූන්ට කරනු ලැබේ. එහෙත් මේ කර්මය ලැබීමට සුදුසුකම් දහහතරකි. ඉන් මිදීමට වත් දහඅටකි. මෙය තජ්ජනීය කර්මය කරනු ලැබූ භික්ෂුව විසින් පිළිපැදිය යුතු වත් දහඅටට සමාන ය.

පටිසාරණීය කර්මය ලැබූ භික්ෂුව ආරාමය අත්හැර ගිය විට සඞඝයා විසින් නැවත ඒ භික්ෂුව එම ආරාමයට

---

1 විනය-චූ.ව. I 5.1

ආපසු යැවිය යුතුය. එබැවින් මෙයට 'පටිසාරණීය කර්මය'යි කියත්. මෙය ප්‍රධාන වශයෙන් ගිහියන්ට ජාත්‍යාදියෙන් ගටා අපහාස කරන භික්ෂූන්ට කරනු ලැබේ. එහෙත් මෙය ලැබීමට සුදුසුකම් විස්සකි. ඉන් මිදීමට වත් දහඅටකි. මේ වත් දහඅට තජ්ජනීය කර්මය කරනු ලැබූ භික්ෂුව විසින් පිළිපැදිය යුතු වත් දහඅටට සමාන ය.

උක්ඛෙපනීය කර්මය ඇවත නොදැකීමෙහි උක්ඛෙපනීය කර්මය, ඇවතට පිළියම් නොකිරීමෙහි උක්ඛෙපනීය කර්මය, සහ ලාමක දෘෂ්ටි අත්නොහැරීමෙහි උක්ඛෙපනීය කර්මය, යනුවෙන් ත්‍රිවිධාකාර වේ. පළමුවැන්න ලැබූ භික්ෂුව නො දුටු ඇවත සඞ්ඝයා විසින් ඔහුට පහද දිය යුතුය. දෙවැන්න ලැබූ භික්ෂුවට සිදු වී ඇති ඇවතට පිළියම සඞ්ඝයා විසින් ඔහුට පහද දිය යුතුය. තෙවැන්න ලැබූ භික්ෂුවගේ දෘෂ්ටිය වැරදි බව සඞ්ඝයා විසින් ඔහුට පහද දිය යුතුය. ප්‍රධාන වශයෙන්, පළමුවැන්න ඇවත නොදන්නා හා ඇවත යටපත් කරන භික්ෂූන්ටද, දෙවැන්න සිදු වූ ඇවතට පිළියම් නොකරන භික්ෂූන්ටද, තෙවැන්න මිථ්‍යාදෘෂ්ටියක් ගත් භික්ෂූන්ටද කරනු ලැබේ. එහෙත් මේ එක් එක් කර්මයක් ලැබීමට සුදුසුකම හය බැගින් ඇත. තෙවැනි ලාමක දෘෂ්ටි අත්නොහැරීමෙහි උක්ඛෙපනීය කර්මයෙන් මිදීමට වත් දහඅටක් වේ. මේ වත් දහඅට තජ්ජනීය කර්මය කරනු ලැබූ භික්ෂුව විසින් පිළිපැදිය යුතු වත් දහඅටට සමාන ය. එහෙත් දෙවැනි, ඇවතට පිළියම් නොකිරීමෙහි උක්ඛෙපනීය කර්මයෙන් මිදීමට වත් හතළිස් තුනක් වේ. මේ වත් හතළිස්තුනට සමාන ය, පළමුවැනි, ඇවත නොදැකීමෙහි උක්ඛෙපනීය කර්මයෙන් මිදීමට ඇති වත් හතළිස්තුන. එනම්, ''උපසම්පද

නො කළ යුතුය, නිස නොදිය යුතුය, මෙරණකු (ලවා තමන්ට) උපස්ථාන නො කරවිය යුතුය, මෙහෙණියන්ට අවවාද කිරීම පිණිස වූ සම්මුතිය නො ඉවසිය යුතුය, සම්මතයෙන් හෝ මෙහෙණියන්ට අවවාද නො කළ යුතුය, යම් ඇවතක් කරණ කොට ගෙන සඞ්ඝයා විසින් ඇවත නොදැකීමෙහි උක්ඛෙපනීය කර්මය කරනු ලැබේ ද, ඒ ඇවතට හෝ එබඳු අනෙක් ඇවතකට හෝ එයට වඩා පාපිෂ්ඨතර ඇවතකට හෝ නො පැමිණිය යුතුය, කර්මයට ගර්හා නො කළ යුතුය, කර්මය කළවුන්ට ගර්හා නො කළ යුතුය, ප්‍රකෘති ස්වභාවය ඇති භික්ෂුව-කගේ වැඳීම, ගෞරව පිණිස අස්නෙන් නැඟී සිටීම, ඇඳිලි බැඳ වැඳීම, පිළිසඳර කථාකිරීම, අසුන් එළවා තැබීම, යහන් එළවා තැබීම, පාදෝනා පැන් තැබීම, පා පුටු තැබීම, පා සේදීමේදී උලන ලෑල්ල තැබීම, පා සිවුරු පිළිගැනීම, (සහ) නෑමේදී පිට ඇතිල්ලීම නො ඉවසිය යුතුය, ප්‍රකෘති ස්වභාවය ඇති භික්ෂුවට ශීල විපත්තියෙන් චෝදනා නො කළ යුතුය, ආචාර විපත්-තියෙන් චෝදනා නො කළ යුතුය, දෘෂ්ටි විපත්තියෙන් චෝදනා නො කළ යුතුය, ආජීව විපත්තියෙන් චෝදනා නො කළ යුතුය, භික්ෂු භික්ෂූන් භෙද නො කළ යුතුය, ගිහිධජ නොදැරිය යුතුය, තීර්ථකධජ නොදැරිය යුතුය, තීර්ථකයින් සේවනය නො කළ යුතුය, භික්ෂූන් සේව-නය කළ යුතුය, භික්ෂු ශික්ෂාවෙහි හික්මිය යුතුය, ප්‍රකෘති ස්වභාවය ඇති භික්ෂුව සමග එක වැසීමක් ඇති ආවාස-යෙහි නො විසිය යුතුය, එක වැසීමක් ඇති අනාවාස-යෙහි නො විසිය යුතුය, එක සෙවිලි ඇති ආවාසයෙහි හෝ අනාවාසයෙහි හෝ නො විසිය යුතුය, ප්‍රකෘති ස්ව-භාවය ඇති භික්ෂුව දැක ආසනයෙන් නැඟී සිටිය යුතුය, ප්‍රකෘති ස්වභාවය ඇති භික්ෂුවට විහාරය තුළදී හෝ

පිටතදී හෝ හිරිහැර නො කළ යුතුය, ප්‍රකෘති ස්වභාව ඇති භික්ෂුවගේ පොහොය නො තැබිය යුතුය, පවාරණය නො තැබිය යුතුය, ඇසිය යුත්තකු නො කළ යුතුය, දෝෂාරෝපණය නො පිහිටුවිය යුතුය, අවසර ගැන්ම නො කරවිය යුතුය, චෝදනා නො කළ යුතුය, (ඇවත්) සිහි නො කරවිය යුතුය, භික්ෂූන් සමග (තඩුහබවල) නො යෙදිය යුතුය''[1]

පාරිවාසිකක්ඛන්ධකයෙහි සහ සමුච්චයකක්ඛන්ධකයෙහි සඞ්ඝාදිසෙස ආපත්තියට පැමිණි භික්ෂුව විසින් එයින් මිදීමට පිළිපැදිය යුතු වත් පිළිවෙත් ආදිය විස්තර වේ. සඞ්ඝාදිසෙසාපත්තියකට පැමිණි භික්ෂුව එයින් මිදීමට, ප්‍රථමයෙන්ම, 'පිරිවෙස්' පිරිය යුතුය. මෙයට වත් අනූ හතරක් ඇත. පිරිවෙස් පුරන කාලය තුළ ඔහු 'පරිවසන්ත' නමි. පිරිවෙස් පුරා අවසන් වූ විට ඔහු 'පරිවුත්ථපරිවාස' නමි. පිරිවෙස් පුරා අවසන් වූ භික්ෂුවට 'මානත්' දෙනු ලැබේ. මානත් ලැබීමට සුදුසු භික්ෂුව 'මානත්තාරහ' නමි. මානත් රාත්‍රී හයක් මුළුල්ලෙහි පිරිය යුතුය. මානත් පුරන කාලය තුළ ඔහු 'මානත්තචාරික' නමි. මානත් පුරා අවසන් වූ විට ඔහු 'චිණ්ණමානත්ත' නමි. මානත් පුරා අවසන් වූ භික්ෂුව 'අබ්භානකර්මය' කිරීමෙන් ඇවතින් පිරිසිදු කරනු ලැබේ. අබ්භානකර්මය ලැබීමට සුදුසුව සිටින භික්ෂුව 'අබ්භානාරහ' නමි.

බොහෝ ඇවත් ඇති භික්ෂුවට ඇවත් සියල්ලටම සරිලන පරිද්දෙන් ප්‍රධාන ඇවත මුල් කොට පිරිවෙස් දිය යුතුය. යම් භික්ෂුවක් ඇවතකට දඬුවම විඳින අතර

---

[1] විනය-චූ.ව. I 27.1

අනෙක් ඇවතකට පැමිණ පළමු ඇවතට අඩුව හෝ සමව හෝ වැඩිව හෝ රාත්‍රී ගණනක් වැසුයේ නම් ඔහු පිරිවෙස් විසූ දින ද, මානත් පිරූ දින ඇතොත් එයද, හැර දමා ('මූලාය පටිකස්සනය' කොට) ඒ සියල්ලටම සරිලන සේ නැවත මුල් ඇවතේ පටන් පිරිවෙස් දිය යුතුය.

පිරිවෙස් දීමට හෝ මානත් දීමට හෝ මූලාය පටිකස්සනයක් දීමට හෝ සමානසංවාසක භික්ෂූන් හතර නමක් හෝ ඊට වැඩියෙන්ද, අබ්භානකර්මය කිරීමට සමාන-සංවාසක භික්ෂූන් විසි නමක් හෝ ඊට වැඩියෙන්ද සිටිය යුතුය. මෙහි ගණපූරණ වශයෙන් පිරිවෙස් ආදිය ලැබූ හෝ ලබන හෝ භික්ෂුව ගැනීම නුසුදුසු ය.

සමථක්ඛන්ධකයෙහි සඞ්ඝ-අධිකරණ පිළිබඳ විස්තර වේ. සඞ්ඝයා විසින් විනිශ්චය කළ යුතු අධිකරණ සියල්ලම කොටස් හතරකට බෙදා ඇත. එනම්, විවාදධිකරණය (විවාද පිළිබඳ අධිකරණය) අනුවාදධිකරණය (දෝෂාරෝපණ පිළිබඳ අධිකරණය), ආපත්තාධිකරණය (ඇවත් පිළිබඳ අධිකරණය) සහ කිච්චාධිකරණය (විනය කර්ම පිළිබඳ අධිකරණය) යන හතර ය. මේ සෑම අධිකරණයක්ම විසඳා සන්සිඳවීමට ක්‍රම සමථ හතක් ඇත. මේ සමථ හත සම්මුඛාවිනය, සතිවිනය, අමූළ්හවිනය, පටිඤ්ඤාතකරණය, යෙභුය්‍යසිකාව, තස්සපාපියාසිකාව සහ තිණවත්ථාරකය යන නම්වලින් හැඳින් වේ. 'සම්මුඛාවිනය' යනුවෙන් හැඳින්වනුයේ චූදිත චෝදකයන් ඉදිරියට ගෙන්වා අධිකරණය විසඳා සන්සිඳුවීම ය. 'සතිවිනය' යනු නැඟූ චෝදනාව වැරදි බව පෙන්වා අධිකරණය විසඳා සන්සිඳවීම ය. 'අමූළ්හවිනය' නම් සිහි මුළා වී ඇවත්වලට පැමිණි බැවින් නිදහස දියයුතු

බව පෙන්වා අධිකරණය විසඳා සන්සිඳවීම ය. අවඩකව ඇවත් දෙසන බව පෙන්වා අධිකරණය විසඳා සන්සිඳ-වීම 'පටිඤ්ඤාතකරණය' නම්. ඡන්දය විමසීමෙන් අධිකරණය විසඳා සන්සිඳවීම 'යෙභුයාසිකාව' ය. වත් පිරිය යුතු බව පෙන්වා අධිකරණය විසඳා සන්සිඳ-වීම 'තස්සපාපියාසිකාව' ය. භික්ෂුවකගේ ඇවත් අන් සියලු භික්ෂූන් වෙනුවෙන් එක් භික්ෂුවක් විසින් සඞසයා මැද දෙසීමෙන් අධිකරණය විසඳා සන්සිඳවීම 'තිණ-වත්ථාරකය' නම්. සම්මුඛාවිනය සහ යෙභුයාසිකාව යන සමථ දෙකෙන් විවාදධිකරණය ද, සම්මුඛා-විනය, සතිවිනය, අමූළ්හවිනය සහ තස්සපාපියාසිකාව යන සමථ හතරෙන් අනුවාදධිකරණය ද, සම්මුඛා-විනය, පටිඤ්ඤාතකරණය සහ තිණවත්ථාරකය යන සමථ තුනෙන් ආපත්තාධිකරණය ද, සම්මුඛාවිනය යන එකම සමථයෙන් කිච්චාධිකරණය ද සන්සිඳවිය යුතුය.

අධිකරණයක් විසඳා ගෙන යන අතර අරගල ආදිය ඇතිවීමෙන් එය සන්සිඳවීමට බාධා පැමිණුන කළ සලාකා ගැන්වීමෙන් (ඡන්දය විමසීමෙන්) එය සන්සිඳ-විය යුතුය. සලාකාගැන්වීම ගුළ්හක, සකණ්ණජප්පක සහ විවටක යනුවෙන් ත්‍රිවිධාකාර වේ. 'ගුළ්හක' යනුවෙන් හැඳින්වනුයේ රහසින් සලාකාගැන්වීම ය. 'සකණ්ණජප්පක' යනු රහසින් කියාදීමෙන් සලාකා-ගැන්වීම ය. ප්‍රසිද්ධියෙහි සලාකාගැන්වීම 'විවටක' නම්.

''මහණෙනි, කෙසේ ගුළ්හක-සලාකාගැන්වීම වේද? ඒ සලාකා ගන්වන්නාවූ භික්ෂුව සලාකාවන් (ඉරටු) වර්ණ සහිතව සහ වර්ණ රහිතව පිළියෙල කොට එක් එක් භික්ෂුව වෙත එළඹ මෙසේ කිය යුතුය: 'මේ මෙසේ

වාදකරන්නාගේ සලාකාව ය. මේ මෙසේ වාදකරන්-නාගේ සලාකාව ය. යමක් කැමැත්තෙහි ද එය ගන්න' ගත් කල්හි කිය යුතුය: 'කිසිවකුට නො දක්වන්න' යනුවෙන්. ඉදින් අධර්මවාදීහු බොහෝ වෙති යි දනියි නම්, 'අයහපත් ගැනීමෙකි' යි කියා නැවත (සලාකා) ඇදිය යුතුය. ඉදින් ධර්මවාදීහු බොහෝ වෙති යි දනියි නම්, 'යහපත් ගැනීමකි' යි කියා ප්‍රකාශකළ යුතුය. මහණෙනි, මේ ගුළ්හක-සලාකාගැන්වීම වේ.

''මහණෙනි, කෙසේ සකණ්ණජප්පක-සලාකාගැන්-වීම වේද? ඒ සලාකාගන්වන්නාවූ භික්ෂුව එක් එක් භික්ෂුවකගේ උපකණ්ණකයෙහි (අනුන්ගේ කථාව ඇසෙන තරමේ දුර තන්හි)—සිට—මෙසේ දැනුම් දිය යුතුය: 'මේ මෙසේ වාද කරන්නාගේ සලාකාව ය, මේ මෙසේ වාදකරන්නාගේ සලාකාව ය, යමක් කැමැත්-තෙහි ද එය ගන්න.' ගත් කල්හි කිය යුතුය; 'කිසිව-කුට නො දක්වන්න' යනුවෙන්. ඉදින් අධර්මවාදීහු බොහෝ වෙති යි දනියි නම්, 'අයහපත් ගැනීමකි, යි කියා නැවත (සලාකා) ඇදිය යුතුය. ඉදින් ධර්මවාදීහු බොහෝ වෙති යි දනියි නම්, 'යහපත් ගැනීමකි' යි කියා ප්‍රකාශකළ යුතුය. මහණෙනි, මේ සකණ්ණජප්පක-සලාකාගැන්වීම වේ.

''මහණෙනි, කෙසේ විවටක-සලාකාගැන්වීම වේද? ඉදින් ධර්මවාදීහු බොහෝ වෙති යි දනියි නම්, සැක නැති ලෙසින්ම විවෘතව (සලාකා) ගැන්විය යුතුය. මහණෙනි, මේ විවටක-සලාකාගැන්වීම වේ.''[1]

ඛුද්දකවත්ථුක්ඛන්ධකයෙහි භික්ෂූන්ගේ දිනපතා ජීවි-

---

[1] විනය-චූ.ව. IV 14.26

තය පිළිබඳව කරුණු දැක්වේ. නහන පුවරුයෙහි භික්ෂූන් නො නෑ යුතුය. නහන්නාවූ භික්ෂුව ගසෙහි හෝ වැඹෙහි හෝ බිත්තියෙහි හෝ ශරීරය ඇතිල්ලීම නො කළ යුතුය. දැවමුවා අතින් හෝ කුරුවින්ද සූත්තියෙන් හෝ මල්ලකයෙන් හෝ ඇඟ උලා නෑම භික්ෂූන්ට නුසුදුසු ය. භික්ෂූන් විසින් දික් වූ නිය, කෙස් හා රැවුල නොදැරිය යුතුය. කොස්සෙන් හෝ පණාවෙන් හෝ මී ඉටි මැලියමින් හෝ ජලය මිශ්‍ර වූ තෙලින් හෝ කෙස් පීරීම භික්ෂූන්ට සුදුසු නොවේ. මුහුණ ආලේප කිරීමද, මුඛයෙහි සහ ශරීරයෙහි පාට ගැල්වීමද භික්ෂූන් විසින් නො කළ යුතුය. ආභරණ ආදිය පැළඳීමද භික්ෂූන්ට සුදුසු නැත. පැසුණු කෙස් ගලවා දැමීමද නො කළ යුතුය. කතුරෙන් කෙස් නො කැප්පිය යුතුය, රැවුළ නො කැප්පිය යුතුය. ලිඞ්ගයෙහි හා කිසිලි දෙකෙහි ලොම් පහකරවීම් නො කළ යුතුය. භික්ෂුව විසින් ඉතා දික් වූ ගීත ස්වරයෙන් ධර්මය ගායනා නො කළ යුතුය. නැටීම හෝ ගැයීම හෝ වැයීම හෝ බැලීමට යෑම භික්ෂූන්ට සුදුසු නැත. එපමණකුද, භික්ෂූන් විසින් නොයෙක් ආකාරයෙහි වූ අනාචාරයෙහි නො හැසිරිය යුතුය.

භික්ෂූන්ගේ පාත්‍ර පිළිබඳ බොහෝ කරුණු මේ ඛන්ධකයෙහි දැක්වේ. යකඩ හා මැටි පාත්‍ර මුත් ලී පාත්‍ර භික්ෂූන්ට සුදුසු නැත. ආයුධ හැර සියලු ලෝහ භාණ්ඩද, දික් පුටුව, කවිච්චිය, ලී පාත්‍රය සහ ලී සෙරෙප්පුව හැර සියලු ලීයෙන් කරන ලද භාණ්ඩ ද, විසිතුරු මැටි පාපිස්ස සහ සම්පූර්ණයෙන්ම මැටියෙන් කරන ලද කුටිය හැර සියලු මැටියෙන් කරන ලද භාණ්ඩ ද භික්ෂූන්ගේ පාවිච්චියට නුසුදුසු නොවේ.

සෙනාසනක්ඛන්ධකයෙහි භික්ෂූන්ගේ විහාර, මන්-

දිර ආදිය සහ ඇඳ, පුටු, ඇතිරිලි ආදිය පිළිබඳ විස්තර වේ. අනාථපිණ්ඩික සිටුවරයාගේ කථාවස්තුවද මෙහි සඳහන් වේ.

උපාලි සහ ශාක්‍ය කුමරුන් සියදෙනාගේ පැවිදිවීම පිළිබඳද, දෙව්දත් කථාවස්තුවද, අජාතසත්තු කථාවස්තුවද දැක්වෙන සඞ්ඝභෙදකක්ඛන්ධකයෙහි සඞ්ඝයාගේ අසමගියට (සඞ්ඝරාජියට) සහ සඞ්ඝයාගේ භෙදයට ඉවහල් වෙන කරුණු දැක්වේ. සඞ්ඝයාගේ අසමගිය විවාදයෙහි දී අධර්මවාදීන් බහුල වීමෙන් සිදුවේ. එහෙත් සඞ්ඝයාගේ භෙදය (බිඳුම) ඇතිවීමට හේතු වන කරුණු අටළොසකි. එනම්, "භික්ෂූහු අධර්මය ධර්මය යි ප්‍රකට කරත් ද, ධර්මය අධර්මය යි ප්‍රකට කරත් ද, විනය නොවූවක් විනය යි ප්‍රකට කරත් ද, විනය වූවක් විනය නොවූවක්ය යි ප්‍රකට කරත් ද, තථාගතයන් විසින් නොකියන ලද නො කරන ලද දෙයක් තථාගතයන් විසින් කියන ලද කරන ලද දෙයක්ය යි ප්‍රකට කරත් ද, තථාගතයන් විසින් කියන ලද කරන ලද දෙයක් තථාගතයන් විසින් නො කියන ලද නො කරන ලද දෙයක් යයි ප්‍රකට කරත් ද, තථාගතයන් විසින් පුරුදු නො කළ වූවක් තථාගතයන් විසින් පුරුදු කළ වූවක් යයි ප්‍රකට කරත් ද, තථාගතයන් විසින් පුරුදු කළ වූවක් තථාගතයන් විසින් පුරුදු නො කළ වූවක් යයි ප්‍රකට කරත් ද, තථාගතයන් විසින් නො පණවන ලද්දක් තථාගතයන් විසින් පණවන ලද්දක් යයි ප්‍රකට කරත් ද, තථාගතයන් විසින් පණවන ලද්දක් තථාගතයන් විසින් නො පණවන ලද්දක් යයි ප්‍රකට කරත් ද, ඇවත් නො වූවක් ඇවතක්යයි ප්‍රකට කරත් ද, ඇවතක් ඇවත් නො වූවක් යයි ප්‍රකට කරත් ද, බරපතළ නොවූ ඇවතක් බරපතළවූ ඇවතක් යයි ප්‍රකට කරත් ද, බරපතළ වූ

ඇවතක් බරපතළ නොවූ ඇවතක් යයි ප්‍රකට කරත් ද, ඉතිරිවීමක් ඇති ඇවතක් ඉතිරිවීමක් නැති ඇවතක් යයි ප්‍රකට කරත් ද, ඉතිරිවීමක් නැති ඇවතක් ඉතිරිවීමක් ඇති ඇවතක් යයි ප්‍රකට කරත් ද, දෝෂතර වූ ඇවතක් දෝෂහීන වූ ඇවතක් යයි ප්‍රකට කරත් ද, දෝෂහීන වූ ඇවතක් දෝෂතර වූ ඇවතක් යයි ප්‍රකට කරත් ද''[1] සඞ්ඝභෙදයට හේතු වේ.

වත්තක්ඛන්ධකයෙහි ආගන්තුක වූ භික්ෂූන් විසින් ද, ආවාසයෙහි වෙසෙන භික්ෂූන් විසින් ද, ගමික වූ භික්ෂූන් විසින් ද, බත්හලෙහි සිටින භික්ෂූන් විසින් ද, පිඬු පිණිස හැසිරෙන භික්ෂූන් විසින් ද, ආරණ්‍යයෙහි වෙසෙන භික්ෂූන් විසින් ද, සෙනාසනෙහි වූ භික්ෂූන් විසින් ද, ගිනිහල්ගෙහි වූ භික්ෂූන් විසින් ද, වැසිකිළියෙහි වූ භික්ෂූන් විසින් ද, පැවතිය යුතු පිළිවෙත් දැක් වේ. උපාධ්‍යායයින් කෙරෙහි සද්ධිවිහාරිකයින් විසින් පැවතිය යුතු පිළිවෙත් ද, සද්ධිවිහාරිකයින් කෙරෙහි උපාධ්‍යායයින් විසින් පැවතිය යුතු පිළිවෙත් ද, ආචාර්යයින් කෙරෙහි අන්තේවාසිකයින් විසින් පැවතිය යුතු පිළිවෙත් ද, අන්තේවාසිකයින් කෙරෙහි ආචාර්යයින් විසින් පැවතිය යුතු පිළිවෙත් ද, මෙහි විස්තර වේ.

පාතිමොක්ඛඨපනක්ඛන්ධකයෙහි පාමොක් උදෙසීමෙහිදී භික්ෂූන් සමග සහවාසයට නුසුදුසු ඇවත්වලට පැමිණියවුන් පිළිබඳ විස්තර වේ.

භික්ඛුනික්ඛන්ධකයෙහි සසුන් වන් මෙහෙණියන් සංවරයෙහි පිහිටුවීමට ඉවහල් වෙන කරුණු දක්වේ. එහි ශාසනයට ඇතුලත්වීම පිණිස මෙහෙණියන් විසින්

---

1 විනය-චු.ව. VII 5.1

පිළිගතයුතු අෂ්ට ගරු ධර්මයන් දක්වේ. එනම්—

1. උපසපන්ව අවුරුදු සියයක් විසූ මෙහෙණිය විසින් අලුතෙන් උපසපන් භික්ෂුවකට වුවත් වැඳීම, උන් අස්නෙන් නැඟිට පෙර ගමන් කිරීම, ඇඳිලි බැඳ වැඳීම, සහ සාමීචිකර්මය කළ යුතුය.
2. මෙහෙණිය විසින් භික්ෂූන් නොමැති ආවාසයෙහි වස් නොවැසිය යුතුය.
3. මෙහෙණිය විසින් අර්ධ මාසයක් පාසා භික්ෂු-සඞ්ඝයා කෙරෙන් පොහොය පිළිවිසීම ද, අවවාද ලැබීමට එළඹීම ද බලාපොරොත්තු විය යුතුය.
4. වස් විසූ මෙහෙණිය විසින් භික්ෂු භික්ෂුණී සඞ්ඝයා වෙත එළඹ නමා දුටු, ඇසූ හා සැක කළ කරුණු පිළිබඳ පවාරණය කළ යුතුය.
5. බරපතළ ඇවතකට පැමිණි මෙහෙණිය විසින් භික්ෂු භික්ෂුණී සඞ්ඝයා වෙත මානත් පිරිය යුතුය.
6. දෑවුරුද්දක් තුළ ශික්ෂාපද හයක හික්මුණු මෙහෙ-ණිය විසින් භික්ෂු භූක්ෂුණී සඞ්ඝයා කෙරෙන් උප-සම්පදව සෙවිය යුතුය.
7. කිසියම් කරුණක් උදෙසා මෙහෙණිය විසින් භික්ෂු-වකට අපහාස නො කළ යුතුය.
8. මෙහෙණිය විසින් භික්ෂුවකට අවවාද වශයෙන් කථා කිරීම නො කළ යුතුය. එහෙත් මෙහෙණි-යන්ට අවවාද වශයෙන් කථා කිරීමට භික්ෂූන්ට අවකාශ ඇත.

අෂ්ට ගරු ධර්මයන් දක්වීමෙන් පසු මෙහි මෙහෙණි යන්ට පමණක් සීමාවූ බොහෝ ශික්ෂාපද දක්වේ. මෙහෙණියන්ගේ දිනපතා ජීවිතය පිළිබඳද කරුණු මෙහි විස්තර වේ. එහෙත්, මෙහෙණියන් ශාසනයෙහි පැවිදිවීමෙන් ශාසනාභිවෘද්ධිය ඇති නොවන බව මෙහි

සඳහන් වේ.— "ආනන්ද, ඉදින් මාගම නො ලද්ද නම් තථාගතයන් විසින් ප්‍රකාශිත ධර්ම විනයෙහි ගිහිගෙයින් නික්ම අනගාරික වූ පැවිද්ද, ආනන්ද, බ්‍රහ්මචරියාව චිරාත් කාලයක් පවතින්නක් වන්නේය; සද්ධර්මය අවුරුදු දහසක් පවතින්නට තිබුණි. ආනන්ද, යම් ලෙසකින් මාගම තථාගතයන් විසින් ප්‍රකාශිත ධර්ම විනයෙහි ගිහිගෙයින් නික්ම අනගාරික වූ පැවිද්දියක වූවා නම්, ආනන්ද, බ්‍රහ්මචරියාව චිරාත් කාලයක් පවතින්නක් නො වන්නේය. ආනන්ද, දැන් අවුරුදු පන්සියයක් කල් පමණ ය, සද්ධර්මය පවතින්නේ."[1]

පඤ්චසතිකක්ඛන්ධකයෙහි රජගහ නුවරෙහි වූ ප්‍රථම ධර්මසඞ්ගායනාව පිළිබඳ විස්තරයක් දැක්වේ. මේ ධර්ම සඞ්ගායනාව සුභද්ද නම් පැවිද්ද බුදුන් කෙරෙහි සහ බුද්ධ ධර්මය කෙරෙහි ගරු සරු නොදැක්වීම හේතු කොට ගෙන ඇති වූවකි. බුදුන්ගේ පිරිනිවීම නිසා බොහෝ අය ශෝක වූ අතර සුභද්ද ශෝක නොවූවා පමණක් නොව ශෝක වූවන්ට ද මෙසේ කියේය: "ඇති ඇවැත්නි, (ඉතින්) ශෝක නො කරව්, නො වැළපෙව්. 'මෙය තොපට කැප ය. මෙය තොපට නො කැප ය'යි මහා ශ්‍රමණයා විසින් උපද්‍රවයට පත්කරන ලද්දෝ වූ අපි (දැන් එයින්) මිදුණෝ වෙමු. දැන් වනාහි අපි යමක් කැමැති වන්නෙමු ද, එය කරන්නෙමු. යමක් කැමති නොවන්නෙමු ද, එය නො කරන්නෙමු."[2]

මෙයින් මහා කාශ්‍යප ආයුෂ්මතුන් වහන්සේ අනාගතයෙහි භික්ෂූන් තුළ ධර්මය සහ විනය කෙරෙහි ගරු සරු

---

[1] විනය-චු.ව. X 1.6
[2] විනය-චු.ව. XI 1.1

අඩුවන නියාව දැන, ධර්මය සහ විනය එක් රැස් කොට සඞ්ගායනා කිරීමට භික්ෂූන්ට ආරාධනා කළ සේක. භික්ෂූන් කැමැති වූයෙන්, මහා කාශ්‍යප ආයුෂ්මතුන් වහන්සේ එක් නමකගෙන් අඩු වූ පන්සියයක් රහතන් වහන්සේලා ද, රහත් බවට නො පැමිණි නමුත් බුදුන් සමීපයෙහි බොහෝ ධර්මයත් විනයත් ඉගෙනගත් ආනන්ද ආයුෂ්මතුන් වහන්සේ ද භික්ෂූන්ගේ අනුදැනීම ඇතිව තෝරාගත් සේක. එහෙත් සඞ්ගායනාවට පෙර දින රාත්‍රියෙහි උදැසන කාලයෙහි ආනන්ද ආයුෂ්මතුන් වහන්සේ ද රහත් බවට පැමිණි සේක.

රජගහ නුවර බොහෝ ගොදුරුගම් සහ සෙනසුන් ඇති හෙයින් එහි වස් වසමින් ධර්මයත් විනයත් සඞ්ගායනය කිරීමට මේ පන්සියයක් භික්ෂූන්ට සම්මතය දෙන නියායෙන්, 'අනෙක් භික්ෂූන් විසින් රජගහ නුවර වස් නො වැසිය යුතුය'යි සඞ්ඝයා විසින් නියම කෙරිණි. එවිට මේ පන්සියයක් භික්ෂූහු ධර්මයත් විනයත් සඞ්ගායනය කිරීමට රජගහ නුවරට ගොස් වස් කාලයෙහි පළමුවන මාසයෙහි කැඩුණු දිරුණු තැන් අලුත්වැඩියා කොට දෙවන මාසයෙහි සඞ්ගායනය ආරම්භ කළහ.

''ඉක්බිති මහා කාශ්‍යප ආයුෂ්මතුන් වහන්සේ උපාලි ආයුෂ්මතුන් වහන්සේට මෙසේ වදාළ සේක:

'උපාලි ආයුෂ්මතුනි, පළමුවන පරිජි ඇවත කොතැනදී පණවන ලද්දක් ද?'

'ස්වාමීනි, විශාලා මහනුවරෙහිදී ය.'

'කවරකු අරබයා ද?'

'සුදින්න නම් කලන්දපුත්‍ර අරබයා ය.'

'කවර වස්තුවක් පිළිබඳ ද?'

'මෛථුන ධර්මය පිළිබඳ ය.'

ඉක්බිති මහා කාශ්‍යප ආයුෂ්මතුන් වහන්සේ උපාලි

ආයුෂ්මතුන් වහන්සේගෙන් පළමුවන පරිජිගෙයේ වස්තුව ද පිළිවිසූ සේක, නිදානය ද පිළිවිසූ සේක, පුද්ගලයා ද පිළිවිසූ සේක, ප්‍රඥප්තිය ද පිළිවිසූ සේක, අනුප්‍රඥප්තිය ද පිළිවිසූ සේක, ඇවත ද පිළිවිසූ සේක, නො ඇවත ද පිළිවිසූ සේක.''[1] මෙසේ මහා කාශ්‍යප ආයුෂ්මතුන් වහන්සේ විනය පිළිබඳ උපාලි ආයුෂ්මතුන් වහන්සේගෙන් ද, ධර්මය පිළිබඳ ආනන්ද ආයුෂ්මතුන් වහන්සේගෙන් ද පිළිවිසූ සේක.

මේ සඞ්ගායනාවට පන්සියයක් භික්ෂූන් සහභාගි වූ හෙයින් මෙය 'පඤ්චසතිකා' යනුවෙන් හැඳින් වේ.

සත්තසතිකක්ඛන්ධකයෙහි විශාලා මහනුවරෙහි වූ දෙවැනි ධර්මසඞ්ගායනාව පිළිබඳ විස්තරයක් දක් වේ. බුදුන් පිරිනිවී අවුරුදු සියයකට පසු විශාලා මහනුවර වජ්ජි පුත්‍රක භික්ෂූහු අවිනය වූ කරුණු දහයක් විනය'යි ප්‍රකාශ කළෝය. කාකණ්ඩක පුත්‍ර වූ යස තෙරුන් මෙයට තදින් විරුද්ධ වී මේ කරුණු දහය අධර්මය ය යි අවිනය ය යි විශාලා මහනුවර වැසි උපාසකයන්ට ප්‍රකාශ කිරීම නිසා වජ්ජි පුත්‍රක භික්ෂූහු ඔහුට උක්ඛෙපනීය කර්මය කළහ. එවිට කොසඹෑ නුවරට පැමිණි යස ආයුෂ්මතුන් වහන්සේ පාවා නුවර වාසී වූ ද අවන්ති දක්ෂිණාපථයන්හි වාසී වූ ද භික්ෂූන්ට මේ පිළිබඳව දන්වා යවා අහෝගඞ්ග පර්වතයෙහි වැඩ උන් සාණවාසී සම්භූත ආයුෂ්මතුන් වහන්සේ කරා එළඹ මෙය සැලකළ සේක. මෙයින් පාවා නුවර වැසි සැටක් පමණ භික්ෂූන්ද අවන්ති දක්ෂිණාපථයෙහි වැසි අට අසූවක් පමණ භික්ෂූන්ද අහොගඞ්ග පර්වතයෙහි රැස්වී යස තෙරුන්ට උක්ඛෙපනීය කර්මය කරනු ලැබීම වැරදි ය යි තීරණය කොට, රෙවත ආයුෂ්මතුන් වහන්සේට මේ බව සහජාති නුවරට පැමිණ සැලකළ විට රෙවත ආයුෂ්මතුන් වහන්-

සේ ද මෙය වැරදි ය යි නිගමනය කළසේක.

ඉක්බිති සඞ්ඝයා ඒ අධිකරණය විනිශ්චය කිරීමට රැස් විය. එහෙත් අධිකරණය උපන් ස්ථානයෙහිම එය සන්සිඳ විය යුතුය යි රේවත ආයුෂ්මතුන් වහන්සේ වදළ හෙයින් භික්ෂූහු අධිකරණය විනිශ්චය කිරීමට විශාලා මහනුවරට වැඩියාහ. රේවත සහ සාණවාසි සම්භූත ආයුෂ්මතුන් වහන්සේලා විශාලා මහනුවර සමීපයෙහි වැඩ විසූ, ආනන්ද ආයුෂ්මතුන් වහන්සේගේ සද්ධිවිහාරික වූ, උපසපන්ව අවුරුදු එක සිය විස්සක් වූ සබ්බකාමී නම් තෙරුන් වහන්සේ වෙත එළඹ දස වස්තූන් පිළිබඳව සැලකළ විට උන්වහන්සේද එය අධර්මය යි අවිනය යි ප්‍රකාශ කළ සේක.

ඉක්බිති සඞ්ඝයා ඒ අධිකරණය විනිශ්චය කිරීමට රැස් විය. එහෙත් අධිකරණය විනිශ්චය කරන විට කෙළවරක් නැති කථා ඇති වන බැවින් එය උබ්බාහිකාවෙන් සන්සිඳ විය යුතුය යි රේවත ආයුෂ්මතුන් වහන්සේ වදළෙන්, එය විනිශ්චය කිරීමට පෙරදිග වැසි පක්ෂයෙහි වූ භික්ෂූන් අතරින් සබ්බකාමී, සාළ්හ, ඛුජ්ජසෝභිත සහ වාසභගාමික යන ආයුෂ්මතුන් වහන්සේලා සතර නමද, පාවා නුවර වැසි පක්ෂයෙහි වූ භික්ෂූන් අතරින් රේවත, සාණවාසි සම්භූත, යස සහ සුමන යන ආයුෂ්මතුන් වහන්සේලා සතර නමද තෝරා ගත්හ. අජිත ආයුෂ්මතුන් වහන්සේ ස්ථවිර භික්ෂූන් වහන්සේලාට අසුන් පනවන්නකු ලෙස තෝරා ගත්හ. අධිකරණය වාලිකාරාමයෙහි විනිශ්චය කිරීමට සම්මත කළ හෙයින් ස්ථවිර භික්ෂූහු එහි වැඩියාහ. විනිශ්චය එහි ආරම්භ කළහ.

''ඉක්බිති රේවත ආයුෂ්මතුන් වහන්සේ සබ්බකාමී ආයුෂ්මතුන් වහන්සේට මෙසේ වදළ සේක:

''ස්වාමීනි, සිඞ්ගිලොණකප්පය කැප වේද?'

'ඇවැත්නි, ඒ සිඞ්ගිලොණකප්පය නම් කුමක් ද?'

'ස්වාමීනි, 'යම් තැනක ලුණු නොමැති (භොජනයක්) වන්නේ නම් එහිදී (මෙය) වළඳන්නෙමි'යි (සිතා) අඟෙහි ලුණු දමා පරිහරණය කිරීමට කැප වේද?'

'ඇවැත්නි, කැප නොවේ.'

'කොතැනදී ප්‍රතික්ෂෙප කරන ලද්දක් ද?'

'සැවැත් නුවරෙහිදී සුත්තවිභඞ්ගයෙහිදී ය.'

'කවර ඇවතකට පැමිණේ ද?'

'සන්නිධිකාරකභොජනයෙහි පචිතියට ය.'

'ස්වාමීනි, සඞ්ඝයා මා ශ්‍රවණය කෙරේවා. මේ ප්‍රථම වස්තුව සඞ්ඝයා විසින් විනිශ්චය කරන ලදී. මෙසේම මේ වස්තුව ධර්මයට විරුද්ධ වූවකි, විනයට විරුද්ධ වූවකි, බුදු සසුනෙන් ඉවත් කරන ලද්දකි. මේ ප්‍රථම සලාකය බහා තබමි.?''[1]

මෙසේ සඞ්ඝයා විසින් දස වස්තූන් විනිශ්චය කොට අධිකරණය සන්සිඳවන ලදී. මේ සඞ්ගායනාවට සත් සියයක් භික්ෂූන් සහභාගි වූ හෙයින් මෙය 'සත්තසතිකා' යනුවෙන් හැඳින්වේ.

## 3. පරිවාර

ශාසනාවචර භික්ෂු භික්ෂුණියන්ගේ කායද්වාරය වාග්-ද්වාරය හික්මවන ධර්මාංශකය වූ විනය පිටකයෙහි අවසාන ග්‍රන්ථය 'පරිවාර' නමින් හැඳින් වේ. ඇතැම්-

---


[1] විනය-චු.ව. XII 2.8

විට මෙය 'පරිවාරපාඨ' යනුවෙන් ද හැඳින් වේ. විනය පිටකයෙහි අනිකුත් ග්‍රන්ථ අනුව සලකා බලන විට මෑත දී ඇතිවූවක් ලෙස සලකන මෙය විනය පිටකයෙහි එතරම් වැදගත් ග්‍රන්ථයක් නොවිය හැකිය. මහාවිභඞ්ග, භික්ඛුණීවිභඞ්ග, සමුට්ඨාන සීසසංඛෙත, අනන්තර-පෙය්‍යාල-සමථභෙද, ඛන්ධක පුච්ඡාවාර, එකුත්තරක, උපොසථාදිවිස්සජ්ජනා, ගාථාසංගණික අධිකරණ භෙද, අපර ගාථාසංගණික, චොදනා කණ්ඩ, චූළසංගාම, මහා-සංගාම, කඨිනභෙද, උපාලිපඤ්චක, සමුට්ඨාන, දුතිය ගාථාසංගණික, සෙදමොචකගාථා, සහ කම්ම-අත්ථවස-පඤ්ඤත්ති-පඤ්ඤත්ත-නවසංගහ-වග්ගා යනුවෙන් හැඳින්වෙන පරිච්ඡෙද දහනවයකින් යුත් මෙය ලක්දිව පැවිද්දකුගේ කෘතියක් විය හැකිය. අභිධර්ම පිටකයෙහි රීතියට බොහෝ සමාන රීතියකින් සකස් වී ඇති මෙය 'මහා නුවණැති, උගත්, දක්ෂ දීප නම් කෙනකු විසින් පෙර ඇදුරන් ගත් මග තැනින් තැන විමසා කරන ලද කෘතියක්' බව ග්‍රන්ථ අවසානයෙහි දක් වේ.[1]

---

[1] පුබ්බාචරියමග්ගඤ්ච පුච්ඡිත්වා'ච තහිං තහිං
දීපනාමො මහාපඤ්ඤො සුතධරො විචක්ඛණො,
ඉමං විත්ථාරසංඛෙපං සජ්ඣාමග්ගෙන මජ්ඣිමෙ
චින්තයිත්වා ලිඛාපෙසි සිස්සකානං සුඛාවහං.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු